| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | - | - | - |
| ජාතික ත්‍යාග | 02 | 02 | - |
| ජාත්‍යන්තර ත්‍යාග | - | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **02** | **02** | - |

ආචාර්ය පී අයි පී පෙරේරා මිය
ජාතික විද්‍යා පදනම මගින් පිරිනමන කුසලතා ත්‍යාගය (විද්‍යාත්මක ප්‍රකාශන)

ආචාර්ය ආර් එච් එම් කේ රත්නායක මිය
ජාතික විද්‍යා පදනම මගින් පිරිනමන කුසලතා ත්‍යාගය (විද්‍යාත්මක ප්‍රකාශන)

### 17.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | - | - | - |
| ජාතික ත්‍යාග | - | - | - |
| ජාත්‍යන්තර ත්‍යාග | 01 | 01 | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **01** | **01** | **-** |

*ජාත්‍යන්තර ත්‍යාග*

**අචාර්ය වී ජී ටී එන් විදානගම මහතා 2015 වර්ෂයේ ජාල පද්ධති කමිටු ත්‍යාගය ( ඉංග්‍රීසි )**

## 17.3 පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | - | - | - |
| ජාතික ත්‍යාග | 03 | 03 | - |
| ජාත්‍යන්තර ත්‍යාග | 02 | 02 | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **05** | **05** | **-** |

*දේශීය ත්‍යාග*

මහාචාර්ය සී වී එල් ජයසිංහ මිය 2015 වර්ෂයේ ඵලදායි පර්යේෂණ ප්‍රකාශන සඳහා පිරිනැමෙන ජනාධිපති ත්‍යාගය

කේ ඩී පී පී ගුණතිලක මයා 2014 වර්ෂයේ විශේෂ පශ්චාද් උපාධි අධ්‍යයන සඳහා පිරිනැමෙන හිරාන් තිලකරත්න ත්‍යාගය

ආචාර්ය ජේ ඒ ඩී එස් එස් ජයකොඩි මහත්මිය වනජීවී සාකච්ඡා සභා සඳහා විශිෂ්ටතම ත්‍යාගය

*ජාත්‍යන්තර ත්‍යාග*

අචාර්ය ඕ ඩී ඒ එන් පෙරේරා මෙය 2015 වර්ෂයේ පොදුරාජ්‍ය මණ්ඩලයීය විශ්වවිද්‍යාල ත්‍යාගය


පී එම් එච් ඩී පතිරාජ මෙය 2015 වර්ෂයේ මාංශ විද්‍යා සංගමය මගින් පිරිනැමෙණ ආචාර්ය උපාධි පර්යේෂණ ප්‍රදානය

# 18. ශාරීරික අධ්‍යාපන අංශය

## 18.1 හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන අංශය අධ්‍යයන ක්‍රියාවලිය සඳහා උපාධි අපේක්ෂකයන්ගේ ශාරීරික හා මානසික සමබරතාව වර්ධනය කරගැනීමේ වැඩසටහන් මගින් දායකත්වය සපයයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අනධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාව අතර සමගිය හා සහයෝගය වර්ධනය කරගැනීම සඳහා ඉතා වැදගත් වන අංශය මෙය වේ.

## 18.2 ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය




## 18.3 බාහිර උපදේශකවරු

පහත සඳහන් ක්‍රීඩා ඉසව් සඳහා බාහිර උපදේශකවරුන් මගින් සේවය ලබාගන්නා අතර ඒ සඳහා විනිසුරු කඳවුරු පැවැත්වීම ද සිදු කෙරේ.

2015 වර්ෂයේ දී ශාරීරික අධ්‍යාපන අංශය සඳහා සුදුසුකම් ලත් බාහිර උපදේශකවරු නව (09) දෙනෙක් පහත සඳහන් ඉසව් සඳහා බඳවා ගන්නා ලදී.

| ක්‍රීඩා ඉසව්ව | නම | සුදුසුකම් |
|---|---|---|
| 1 බේස් බෝල් | කේ එස් කුමාර මහතා | පුහුණුකරු 18න් පහළ ජාතික බේස් බෝල් කණ්ඩායම |
| 2 බැඩ්මින්ටන් | ඔම් ආර් එම් පෙරේරා | නායක බැඩ්මින්ටන් කණ්ඩායම වයඹ විශ්වවිද්‍යාලය |
| 3 කැරම් | බී ඩී ආර්කුමාර මයා | ජාත්‍යන්තර කැරම් ශූරතාව |
| 4 එල්ලේ | ජී. විමලසිරි මහතා | වයඹ පළාත් හොඳම ජාතික ක්‍රීඩකයා |
| 5 හොකි | ඩබ්ලිව්.එස්.එම්.ඩී. බොතේජු මහතා | ශ්‍රී ලංකා ගුවන් හමුදා හොකි කණ්ඩායමේ නියෝජිත |
| 6 කරාතේ | ඩබ් එස් ආර් ප්‍රනාන්දු මහතා | ජාත්‍යන්තර කළු පටි ශූර |
| 7 රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන පෙළ රග්බි පුහුණුකරු |
| 8 පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | ශිල්ප ශාලිකා ආයතනයේ පිහිනුම් උපදේශක |
| 9 මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | පාසල් විනිසුරු |
| 10 බර ඉසිලීම | එල්.ආර්.සී.එල්.කේ. ලියනගෙදර මහතා | ජාතික ක්‍රීඩක |

## 18.4 වාර්ෂික ක්‍රීඩා වැඩසටහන්

### 18.4.1 පීඨාන්තර නවක ශිෂ්‍ය තරගාවලිය 2015

නව පරිශ්‍රයකට ප්‍රවේශ වන විට නවක ශිෂ්‍යයන්ගේ ක්‍රීඩා කුසලතාවර්ධනය කරලීම සඳහා නව්‍යමය ක්‍රීඩා කටයුතු අවශ්‍ය කෙරේ. මෙම අත්‍යවශ්‍ය අංගයන් අවබෝධකොට ගනිමින් ශාරීරික අධ්‍යාපන අංශය මගින් වාර්ෂිකව පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් පවත්වමින් විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා දිරිමත් කිරීමට කටයුතු කෙරේ. 2015 වර්ෂය තුළ දී ශාරීරික අධ්‍යාපන අංශය මගින් පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් සූදානම් කරන ලද අතර ගැහැණු පිරිමි ක්‍රීඩා ඉසව් එකොළහක් (11) මේ සඳහා සූදානම් කෙරිණි.

1. බැඩ්මින්ටන්
2. බාස්කට් බෝල්
3. කැරම්
4. චෙස්
5. ක්‍රිකට්
6. එල්ලේ
7. පාපන්දු
8. දැල්පන්දු
9. මේසපන්දු
10. පැසිපන්දු
11. බර ඉසිලීම


2015 මාර්තු මස 23-31 දින අතර තුර කුලියාපිටිය හා මකඳුර පරිශ්‍රයේ දී මෙම තරග ඉසව් පැවැත්විණි.

**අන්තර් පීඨ නවක ශිෂ්‍ය තරගාවලිය අවසන් ප්‍රතිඵලය**

| | |
|---|---|
| ශූරතාව | - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය |
| පළමු අනුශූරතාව | - ව්‍යවහාරිකවිද්‍යා පීඨය |
| දෙවන අනුශූරතාව | - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය |
| සිව්වන ස්ථාන | - පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය |

**අන්තර පීඨ නවක ශිෂ්‍ය සහභාගීත්වය**

| 2015 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | **කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය** | **ව්‍යවහාරිකවිද්‍යා පීඨය** | **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය** | **පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය** | |
| පිරිමි | 73 | 56 | 118 | 32 | 279 |
| ගැහැණු | 22 | 36 | 88 | 18 | 164 |
| එකතුව | 95 | 92 | 206 | 50 | 443 |
| 2015 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 133 | 126 | 475 | 92 | 826 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 71.42% | 73% | 43.36% | 54% | 53.63% |




### 18.4.2 අන්තර් පීඨ තරගාවලිය 2015

2015 ඔක්තෝම්බර මස 20වන දින සිට නොවැම්බර් මස 05 වන දින දක්වා අන්තර් පීඨ තරගාවලිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සහ ශිල්පශාලිකා පරිශ්‍රයේ දී පැවැත්විණි. ක්‍රීඩා තරග ඉසව් 23ක් පැවැත් වූ අතර මේ සඳහා පිහිණුම් තරග මෙන්ම ජවන හා පිටිය තරග ඉසව්ද පැවැත්විණි.

### 18.4.2 අන්තර් විශ්වවිද්‍යාලයීය තරගාවලිය 2015

2015 මැයි 16 සිට අගෝස්තු 30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය මගින් සංවිධානය කරන ලද 38 වෙනි අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව විශ්වවිද්‍යාල 14ක සහභාගීත්වයෙන් පැවැත්විණි.

**2015 අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාවේ ජයග්‍රහණයන්**


සමස්ත ජයග්‍රහණ - විශ්වවිද්‍යාල 14ක් අතර 10වෙනි ස්ථානය හිමි විය.


**කණ්ඩායම් ඉසව්**

| **ඉසව්ව** | **ස්ථානය** |
|---|---|
| එල්ලේ (පිරිමි) | අනුශූරතාව |
| එල්ලේ (ගැහැණු ) | අනුශූරතාව |
| මල්ලවපොර | අනුශූරතාව |
| පැසි පන්දු (පිරිමි ) | |
| මේස පන්දු (පිරිමි ) | |
| ක්‍රිකට් | |

2015 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව සහභාගීත්වය

| 2015 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | ව්‍යවහාරිකවිද්‍යා පීඨය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය | |
| පිරිමි | 28 | 98 | 101 | 18 | 245 |
| ගැහැණු | 14 | 42 | 51 | 02 | 109 |
| එකතුව | 42 | 140 | 152 | 20 | 354 |
| 2015 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 409 | 505 | 1223 | 549 | 2686 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 10.26% | 27.72% | 12.43% | 3.64% | 13.18% |



## 18.5 විශේෂ වැඩසටහන්

සමාජයට සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් ශ්‍රම බලකායක් ගොඩනැගීමේ අරමුණින් අපේ අංශය කැපවීමෙන් කටයුතු කරයි. එම අරමුණින් අපේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය සඳහා විස්තරාත්මක වැඩසටහන් ඉදිරිපත් කරන්නෙමු.

### 18.5.1 නම්නීකරණ වැඩසටහන.

අලුතින් විශ්වවිද්‍යාලවලට පැමිණෙන සිසුන් සඳහා ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්යභාරය පිළිබඳව හඳුන්වා දෙමින් එහි මෙහෙවර හා දැක්ම, වෘත්තීය තත්වය ක්‍රියාකාරකම් සහ අනාගත ප්‍රතිලාභ සහ විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතුවල නියැලීමේ ඇල්ම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක විය.

### 18.5.2 අධ්‍යයන සහායක වැඩමුළුව.

ක්‍රීඩා විද්‍යා හා අභ්‍යාස පිළිබඳ වැඩමුළුවක් තෙවන වසර ක්‍රීඩා පෝෂණ සිසුන් සඳහා පෝෂණ අධ්‍යයන අංශයේ ඉල්ලීම මත මෙහෙයවන ලදී. ඔවුන්ගේ අධ්‍යයන විෂයන්ට අදාළව දැනුම වර්ධනය කරගැනීම සඳහා මෙය මහගු අවස්ථාවක් විය.

## 18.6 මූල්‍ය ප්‍රකාශය

**වාර්ෂික වියදම**

| අංකය | විස්තරය | ගණන (රු) |
|---|---|---|
| 01 | අන්තර්පීඨ පළමු වසර සිසුන්ගේ ශූරතාව | 46,110.00 |
| 02 | අන්තර්පීඨ ශූරතාව | 92,089.50 |
| 03 | අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව | 394,905.50 |
| 04 | ක්‍රීඩා උපකරණ | 3,438,845.29 |
| 05 | ක්‍රීඩා ඇඳුම් | 1,547,895.00 |
| 06 | පුහුණු හා පුහුණු තරග | 41,454.00 |
| 07 | බාහිර තරග | 179,335.00 |
| 08 | සුළු මුදල් | 29,364.00 |
| 09 | දුරකථන බිල්පත් | 13,006.96 |
| 10 | SLUSA දායකත්ව මුදල් | 100,000.00 |
| 11 | බාහිර උපදේශක ගාස්තු | 491,500.00 |
| | **වාර්ෂික මුළු වියදම** | **6,374,505.25** |

## 18.7 ක්‍රීඩා ක්ෂේත්‍රයේ යහපත් අනාගතයක් උදෙසා සැලකිය යුතු කරුණු.

1) එකම කාලවකවානුවක දී සියලු පීඨයන්හි අධ්‍යයන කටයුතු ඇරඹීම.
2) අවම වශයෙන් ප.ව. 4.30ට පමණ සිසුන් අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.
3) සිසුන් ශාරීරික අධ්‍යාපන කටයුතුවලට යොමු කිරීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ සහයෝගය ලබා දීමේ මට්ටම ඉහළ දැමීම.
4) විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සිසුන් ක්‍රීඩා කටයුතුවල නියැලෙන විට දේශන සඳහා සහන සැලැස්වීම සහ ක්‍රමවේදයක් සැකසීම.

# 19 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස ස්ථාපනය කරන ලද්දකි. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය හා මෘදු කුසලතාඉහළ නැංවීමේ අභිලාසයෙන් පිහිටුවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන් හා ආයතන අතර යම් සබඳතාවක් මේ හරහා ගොඩ නැගෙයි. ආරම්භයේ සිට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් ඉහත පරමාර්ථය පදනම් කොටගත් නොයෙකුත් අවස්ථාවන් සංවිධානය කරනු ලැබ ඇත. මෙම අංශය උපකුලපති තුමා යටතේ ඍජුව පාලනය වෙයි.

තම අධ්‍යයන පසුබිමේ සිට වෘත්තීය ඉලක්කයන් කරා යොමුවීමට සිසුන්ට සාර්ථක දිරිගැන්වීමක් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිදු කෙරේ. මේ අනුව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමබර අන්දමින් ඍජු සේවා, අධ්‍යාපන වැඩසටහන් සහ සම්පත් ද්‍රව්‍ය ආදිය සැපයීම සිදු කොට ඇත.

ඒ අනුව ශිෂ්‍යයන්ට

- අර්ථවත් රැකියා සොයාගැනීමට උපකාරී වීම
- පුහුණුව සඳහා ආයතන සොයාගැනීම
- ඔවුන්ගේ වෘත්තීය අභිලාසයන්ට සරිලන පරිදි අමතර අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට උපකාරී වීම

යන පහසුව ලැබෙයි.

ව්‍යාපෘති සඳහා සහභාගී වීමට සිදුවන උපාධි අපේක්ෂකයනට මෘදු කුසලතාපිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි පුද්ගල සංවර්ධන වැඩසටහන් ප්‍රයෝජනවත් වෙයි.

වෙළඳ ලෝකයේ පැවැත්ම සඳහා ඔවුන්ට මේවා අතිශයින්ම වැදගත් වෙයි. මෙම වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් පමණක් පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ ස්වාභාවයෙන් පවත්වනු ලබන වෘත්තීය වෙලඳපොළ (පෞද්ගලික ආයතන සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන ) සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබති.

## දැක්ම

යාවජීව අධ්‍යාපනය, ආර්ථික සමෘද්ධිමත් භාවය, මානසික ස්ථාවරත්වය සහ සහ සමාජ සංචලනය සහ අවසන් ඉලක්කය කරා මෙහෙය වන සංකීර්ණ කාර්යමය ලෝකයේ ප්‍රශස්ත වෘත්තීය අවස්ථා ලඟාකර දෙන තත්වයෙන් උසස් සහ අත්‍යවශ්‍ය වෘත්තීය සහ මෘදු කුසලතාවලින් සමන්විත උපාධිධාරීන් පිරිසක් ලෙස දැනුවත්භාවය ඇතිකිරීම සහ සවිබල ගැන්වීම.


## මෙහෙවර

වෘත්තීය හා මෘදු කුසලතාවර්ධනය කරගැනීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ආයතනික සම්බන්ධතාව වර්ධනය කිරීම මගින් සිසුන් තත්වයෙන් උසස් වෘත්තිකයන් බවට පත්කරලීමෙන් උද්යෝගී ගෝලීය පුරවැසියන් වීමට අවස්ථාව අපි සලසා දෙන්නෙමු.

## අරමුණු

- වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ පුහුණුවීම් වැනි විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- සිසුන්ට ගැලපෙන හා තාත්වික වෘත්තීන් තෝරාගැනීමට සහ වෘත්තීය මග පෙන්වීමට සහාය වීම
- අධ්‍යාපනික සංවර්ධනය උදෙසා දායක වීමට තරුණයින් පෙළඹවීම
- සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන් මග සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු පෙලගැස්වීමට මග පෙන්වීම.
- අන්තර්ජාලය හරහා වෘත්තීය පුහුණු අවස්ථා හා රැකියා අවස්ථා පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කිරීම.
- ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන්, රැකියා සහ ඉගෙන ගැනිමේ අවස්ථා පිළිබඳ කළමනාකරණය කිරීම සහ තොරතුරු ලබාදීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට ජීව දත්ත සකස් කිරීමට සහ සිසුන්ගේ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට උදව් වීම.

## 19.4 අපගේ ආයතනික සැලැස්ම




## 19.5 කාර්ය මණ්ඩලය

| තනතුර | නම |
|---|---|
| අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා |
| වෘත්තීය උපදේශක | එස් ඩී ජී ජයසූරිය මහතා |
| පරිගණක යෙදවුම් සහකාර | එන් සී එස් ජනකසිරි මහතා |

මීට අතරව එක් පීඨයකින් එක් නියෝජිතයකු බැගින් පීඨ හතර සඳහා සම්බන්ධීකාරකවරු පත්කොට ඇත

| සම්බන්ධීකාරකවරයාගේ නම | පීඨයේ නම |
| --- | --- |
| අචාර්ය එන් ආර් අබේනායක මිය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය |
| ඩී එම් ජයසේන මහතා | ව්‍යවහාරිකවිද්‍යා පීඨය |
| ඩබ් ඒ ඩී කේ ජයේන්ද්‍රිකා මිය | ව්‍යාපාර අධ්‍යයන හා මූලය පීඨය |
| බී පී ඒ ජයවීර මයා | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය |

## 19.6 2015 වර්ෂය තුළ මෙහෙය වන ලද පුහුණු දැනුවත් කිරීමේ වැඩසටහන්

පහත සඳහන් සටහනෙහි 2015 වර්ෂය තුළ මෙම ඒකකය මගින් මෙහෙය වන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු අන්තර් ගත වේ.

| අංකය | වැඩසටහන | සම්පත් හා තාක්ෂණ එකතුව | විෂය පථය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 01 | බාහිර පුහුණුව සහ ඓතිහාසික යාපහුව නැරඹීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන එකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 ජනවාරි 29 | සිසුන් 120 | යාපහුව කඳු ප්‍රදේශය |
| 02 | රැකියා පොළ - 2015 | රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන | සේව නියුක්ති කුසලතා වර්ධනය | කුලියාපිටිය පරිශ්‍රයේ අවසන් වසර සිසුන් | 2015 පෙබරවාරි 25 | සිසුන් 250 යි | කුලියාපිටිය පරිශ්‍රය |
| 03 | විභාග සඳහා සාර්ථකව මුහුණ දීම සහ කාල කළමනාකරණය | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන එකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 මාර්තු 09 | සිසුන් 170 | මාකඳුර පරිශ්‍රය |
| 04 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන එකකය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු ලබා දීම | ප්‍රථම වසර සිසුන් පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 2015 මාර්තු 10 | සිසුන් 84 | මාකඳුර පරිශ්‍රය |
| 05 | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන එකකය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු ලබා දීම | දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 මාර්තු 25 | සිසුන් 100 | මාකඳුර පරිශ්‍රය |
| 06 | කලා වැඩමුළුව | කතික කලා බවන කාර්ය මණ්ඩලය | සේව නියුක්ති කුසලතා වර්ධනය | බලා කවයේ සමාජිකයන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 මාර්තු 28 | සිසුන් 20 | ජාතික කලා බවන කොළඹ |
| 07 | සහතික පත්‍ර ප්‍රදානෝත්සවය | මහචාර්ය ඩී පී එස් ටී ජී අත්තනායක මහතා පීඨාධිපති කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | - | දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 අප්‍රේල් 01 | සිසුන් 150 | මාකඳුර පරිශ්‍රය |
| 08 | NDB බැංකුවේ සෘජු සම්මුඛ පරීක්ෂණය | NDB බැංකුවේ කාර්ය මණ්ඩලය | සේව නියුක්ති කුසලතා වර්ධනය | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2014 අප්‍රේල් 06 | සිසුන් 130 | කුලියාපිටිය පරිශ්‍රය |

| අංකය | වැඩසටහන | සම්පත් හා තාක්ෂණ එකතුව | විෂය පථය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 09 | පුද්ගල තොරතුරු පෙළගැස්ම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 අප්‍රේල් 22 | සිසුන් 150 | මාකඳුර පරිශ්‍රය |
| 10 | පුද්ගල තොරතුරු පෙළගැස්ම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 මැයි 13 | සිසුන් 130 | මාකඳුර පරිශ්‍රය |
| 11 | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | දයානි එදිරිසිංහ මහත්මිය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 මැයි 20 | සිසුන් 113 යි | මාකඳුර පරිශ්‍රය |
| 12 | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | ධම්මික ගුණවර්ධන මහතා | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 ජූනි 03 | සිසුන් 32 | මාකඳුර පරිශ්‍රය |
| 13 | ඉල්ලුම්පත්‍ර ලිවීමේ වැඩමුළුව | ජිෆ්රියා මෙය අධ්‍යක්ෂ Jobs for you ආයතනය | පර්යේෂණය හා සංවර්ධන කුසලතා වර්ධනය | පළමු වසර හා අවසන් වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 ජූනි 08 | සිසුන් 140 | කුලියාපිටිය පරිශ්‍රය |
| 14 | කලා කවය වැඩසටහන | අචාර්ය ඩබ් ඒ අබේසිංහ | සේව නියුක්ති කුසලතා වර්ධනය | මාකඳුර පරිශ්‍රයේ සිසුන් | 2015 ජූනි 29 | සිසුන් 250 | මාකඳුර පරිශ්‍රය |
| 15 | සීමා වාසික රැකියා සඳහා සෘජ සම්මුඛ පරීක්ෂණ | Good Hope ආයතනය | අත්දැකීම හා සේවා නියුක්ති කුසලතා වර්ධනය | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2015 ජූලි 03 | සිසුන් 150 | කුලියාපිටිය පරිශ්‍රය |
| 16 | තේ රස බැලීම වැඩමුළුව | උපාලි ප්‍රේමලාල් මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | පර්යේෂණ සංවර්ධන කුසලතා | තෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 ජූලි 13 | සිසුන් 38 | මාකඳුර පරිශ්‍රය |
| 17 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීම | ආචාර්ය බී එම් කේ පෙරේරා | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය | 2015 ජූලි 22 | 30 | මාකඳුර පරිශ්‍රය |

| අංකය | වැඩසටහන | සම්පත් හා තාක්ෂණ එකතුව | විෂය පථය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 18 | බාහිර පුහුණුව හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන | AOA ඇඩ්වෙන්චර් ඇකඩමිය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | ප්‍රථම වසර සහ දෙවන වසර සිසුන් පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 2014 සැප්තැම්බර් 05,06 | සිසුන් 50 | බෙලිහුල්ඔය |
| 19 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | ප්‍රථම වසර උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2014 සැප්තැම්බර් 09 | සිසුන් 500 | කුලියාපිටිය පරිශ්‍රය |
| 20 | වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව පොළ | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය රජරට විශ්වවිද්‍යාලය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | තෙවන වසර සහ සිව්වන වසර සිසුන් | 2014 සැප්තැම්බර් 11 | සිසුන් 50 | රජරට විශ්වවිද්‍යාල පරිශ්‍රය |
| 21 | ඔබ අසිරිමත් වැඩ මුළුව | මිනිස්බල හා රැකියා අමාත්‍යාංශය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2014 සැප්තැම්බර් 23,24,25 | සිසුන් 40 | කුලියාපිටිය පරිශ්‍රය |
| 22 | ස්වේඡ්චා නායකත්ව කුසලතා | - | සේවා නියුක්ති කුසලතා වර්ධනය | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2014 ඔක්තෝබර් 01 | සිසුන් 20 | අනුක්කනෙ මහා විද්‍යාලය |
| 23 | හරිත බැංකු වැඩමුළුව | මහජන බැංකුව | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2014 ඔක්තෝබර් 01 | සිසුන් 200 | කුලියාපිටිය පරිශ්‍රය |
| 24 | උයදුම්පත් ලිවීම පිළිබඳ වැඩ මුළුව | ජෝන් කීල්ස් පදනම | සේවා නියුක්ති කුසලතා වර්ධනය | තෙවන වසර සහ සිව්වන වසර සිසුන් | 2015 නොවැම්බර් 20,21,22 | සිසුන් 500 | කුලියාපිටිය පරිශ්‍රය |
| 25 | අයදුම්පත් ලිවීම පිළිබඳ වැඩ මුළුව | ගාමිනී ජයසූරිය වෘත්තීය උපදේශක වෘත්තීය උපදේශන ඒකකය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2015 ඔක්තෝබර් 14 | සිසුන් 250 | කුලියාපිටිය පරිශ්‍රය |
| 26 | ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය | සම්පත් අලුත්පටබැඳිගේ මහතා ආයතනික පුහුණුකරු | පර්යේෂණ සංවර්ධන කුසලතා | උපාධි අපේක්ෂකයින් ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | 2015 ඔක්තෝබර් 19 | සිසුන් 30 | කුලියාපිටිය පරිශ්‍රය |

| අංකය | වැඩසටහන | සම්පත් හා තාක්ෂණ ඒකකුව | විෂය පථය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 27 | උපාධිදාරී ව්‍යවසාය උදානය වැඩ මුළුව | NEDA ආයතනය | ව්‍යවසායකත්ව කුෂලතා සංවර්ධනය | ප්‍රතම වසර දෙවන වසර සහ තෙවන වසර සිසුන් | 2015 ඔක්තෝබර් 28 29 | සිසුන් 30 | මාකඳුර පරිශ්‍රය |
| 28 | බාහිර පුහුණුව හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන | ෂනත් ගුණතිලක මහතා AOA ඇඩ්වෙන්චර් ඇකඩමිය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | ප්‍රතම වසර දෙවන වසර සහ සිසුන් | 2015 ඔක්තෝබර් 30 31 සහ නොවැම්බර් 01 | සිසුන් 50 | බෙලිහුලොය |
| 29 | සම්මුඛ පරීක්ෂණ සඳහා තනිව මුහුණදීම | නයනා කරුනාරත්න මෙය අධ්‍යක්ෂ image consultancy ආයතනය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | උපාධි අපේක්ෂකයන් ඕාකඳුර පරිශ්‍රය | 2015 නොවැම්බර් 04 | ෂිසුන් 220 | මාකඳුර පරිශ්‍රය |
| 30 | පුදගල සංවර්ධන සහ ආහාර ගැනීමේ චර්යා රටාවන් | නයනා කරුනාරත්න මෙය අධ්‍යක්ෂ image consultancy ආයතනය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | හැවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 නොවැම්බර් 05 | ෂිසුන් 35 | Global Tower හෝටලය කොළඹ |
| 31 | ණායකත්ව සංවර්ධන වැඩමුළුව | ශ්‍යාම් වීරතුංග මහතා ඕානව සම්පත් කළමණාකරු ඊර්බාසං ආයතනය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | තෙවන වසර සිසුන් පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 2015 නොවැම්බර් 11 | ෂිසුන් 60 | මාකඳුර පරිශ්‍රය |
| 32 | ඡායාරූප කරණය ප්‍රදර්ශණය | ණිහාල් සඟබෝ ඩයස් මහතා කතික කළා භවන | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ කලා කවය සමාජිකයන් | 2015 නොවැම්බර් 18 | ෂිසුන් 50 | මාකඳුර පරිශ්‍රය |
| 33 | උපාධිදාරී ව්‍යවසාය උදානය වැඩ මුළුව | NEDA ආයතනය | ව්‍යවසායකත්ව කුෂලතා සංවර්ධනය | උපාධි අපේක්ෂකයන් | 2015 නොවැම්බර් 26 27 | සිසුන් 30 | මාකඳුර පරිශ්‍රය |
| 34 | බාහිර පුහුණුව හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන | සනත් ගුණතිලක මහතා AOA ඇඩ්වෙන්චර් ඇකඩමිය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | ප්‍රතම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2015 දෙසැම්බර් 11 12 13 | සිසුන් 34 | බෙලිහුල්ඔය |
| 35 | උපාධිදාරී ව්‍යවසාය උදානය වැඩ මුළුව | NEDA ආයතනය | ව්‍යවසායකත්ව කුෂලතා සංවර්ධනය | උපාධි අපේක්ෂකයන් | 2015 දෙසැම්බර් 15 | සිසුන් 30 | මාකඳුර පරිශ්‍රය |

### 19.7 වර්ෂයේ වැඩසටහන් සමාලෝචනය

2015 වර්ෂය තුළ පීඨ හතරෙහි සිසුන් සඳහා වැඩසටහන් 35 ක් ක්‍රියාත්මක කිරීමට වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයට හැකි විය.

| **පීඨය** | වැඩසටහන් |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 13 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 01 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 09 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 03 |
| මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක | 02 |
| කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක | 01 |
| විශ්වවිද්‍යාලයේ පීඨ හතර | 05 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 01 |
| **එකතුව** | **35** |

### 19.8 2015 වර්ෂයේ අපගේ වැඩසටහන්වලට සම්බන්ධ වූ සිසුන්හට ලැබෙන වරප්‍රසාද හා දීමනා

- නායකත්ව පුහුණු
- ශිෂ්‍ය සමාගම් වැඩසටහන්
- බාහිර පුහුණු වැඩමුළු
- කර්මාන්තමය පුහුණුව
- රැකියා සඳහා ස්ථානගතවීම
- අයදුම්පත්‍ර ලිවීම ප්‍රගුණ කිරීම
- පෞද්ගලික උපදේශන
- ශිෂ්‍ය දත්ත එකතුව
- රැකියා වෙළඳ පොල
- පුද්ගල පෞරුෂ හා ආකල්ප වර්ධනය

### 19.9 2015 විශේෂ ජයග්‍රහණ

- කුලියාපිටිය පරිශ්‍රයේ රැකියා වෙළඳපොළ සංවිධානය කිරීම
- වර්ෂය තුළ වැඩසටහන් 35 ක් ක්‍රියාත්මක කිරීම

### 19.10 2015 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්

- **වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ මානව සම්පත් සංවර්ධන කටයුතු**
    - පර්යේෂණ කටයුතු සඳහා දායක වීම
    - නව පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීත්වය
    - උසස් අධ්‍යාපනයට සහ ක්ෂේත්‍ර චාරිකාවලට සම්බන්ධවීම

➢ **භෞතික සම්පත් සංවර්ධනය**

| ඒකකය | ප්‍රමාණය |
|---|---|
| කැම්කෝඩර් | 01 |
| නාන කාමර | 01 |
| පොත් සහ සඟරා (පුස්තකාලය සඳහා) | - |
| වානේ අල්මාරි (6'×4'×1.5) | 03 |

**සිසුන් සඳහා නව වැඩසටහන්**

- ආකෘති සම්මුඛ පරීක්ෂණ - පටිගත කිරීම් සහිතව
- සමාජීය වගකීම් වැඩසටහන් සහ සේවා
- අධ්‍යයන චාරිකා සහ පර්යේෂණ සඳහා සහභාගීත්වය
- ශිෂ්‍ය තොරතුරු ජාලගත කිරීම
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- බඳවා ගැනීම් ඒජන්සි සමග සම්බන්ධතා ගොඩ නංවා ගැනීම

## 19.11 සමාප්තිය

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2015 වර්ෂයේ දී වැඩසටහන් 25ක් මෙහෙය වීය. මේ තුළින් අපගේ ශිෂ්‍යයන්හට පහත සඳහන් පුද්ගල කුසලතා ඉහළ නංවා ගැනීමට හැකිවිය

- නව චින්තනය
- උනන්දුව ඇතිකර ගැනීම
- නිර්මාණාත්මකබව
- නම්‍යශීලී බව
- සම්පත්දායකත්වය
- කාර්යශූර
- ශක්‍යතාපිරි
- අවංක
- ස්වයං ප්‍රලෝභන
- ධනාත්මක ආකල්ප පිරි
- උපායශීලී
- වගකීම් දරන
- වෙළඳ ක්ෂේත්‍රයට අවතීර්ණ
- සිතීමේ හැකියාවෙන් යුත්
- විනය ගරුක
- දැඩිව ක්‍රියාවන්හි එල්බගත්
- විනෝදකාමී
- උනන්දුවෙන් පිරි

**19.12** වර්ෂය තුළ සිදු කරන ලද සියලු කාර්යන් සඳහා වැය වූ මුළු වියදම

| අංකය | වැඩසටහන | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම | HETC අරමුදල් |
|---|---|---|---|
| 1 | කලා වැඩමුළුව | 13256 | - |
| 2 | EDEX වෘත්තීය ප්‍රදර්ශනය | - | - |
| 3 | කවුළුව (කලා කවය වැඩසටහන) | 10456.00 | - |
| 4 | නායකත්වයල ජීවන කුසලතාසහ වෘත්තීය සංවර්ධන වැඩසටහන | 61200ග00 | - |
| 5 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | නැත | - |
| 6 | බාහිර පුහුණුව ඓතිහාසික යාපහුව නැරඹීම | 30718ග00 | - |
| 7 | වෘත්තීය මාර්ගෝපදේශණ දැනුවත්කිරීමේ වැඩසටහන | නැත | නැත |
| 8 | විභාග වලදී සාර්ථක සාර්ථක වන්න - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | නැත | නැත |
| 9 | විභාග වලදී සාර්ථක සාර්ථක වන්න - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | නැත | නැත |
| 10 | කොළඹ කොටස් හුවමාරුව පිළිබඳ වැඩමුළුව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 784.00 | නැත |
| 11 | ඔබේ වෘත්තියේ සාර්ථක වන්නේ කෙසේද? | 864.00 | නැත |
| 12 | තේ රස පරීක්ෂණය වැඩමුළුව | 6307.00 | නැත |
| 13 | සම්මුඛ පරීක්ෂණ කොකා කෝලා | 1255.00 | නැත |
| 14 | බාහිර පුහුණුව - නායකත්ව කඳවුර කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | නැත | 275,000.00 |
| 15 | සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දීම සහ අයදුම්පත් ලිවීම වැඩමුළුව | නැත | නැත |
| 16 | බාහිර පුහුණුව - නායකත්ව වැඩමුළුව ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය හා ව්‍යවහාරිකවිද්‍යා පීඨය | නැත | 275000.00 |
| 17 | ප්‍රගමනය (කලා කව වැඩසටහ) | 14975ග00 | නැත |
| 18 | ඔබගේ වෘත්තියේ සාර්ථක වන්නේ කෙසේද සහතික පත්‍ර ප්‍රදානය | 4210.00 | නැත |
| 19 | උපාධිධාරී ව්‍යාපාරික උදානය වැඩසටහන | 3350.00 | නැත |
| 20 | අයදුම්පත් ලිවීම (ජීව දත්ත) වැඩමුළුව | නැත | නැත |
| 21 | අයදුම්පත් ලිවීම සහ සම්මුඛ පරීක්ෂණවලට මුහුණදීම වැඩමුළුව | 11660.00 | නැත |
| 22 | ජෝන් කීල්ස් පදනම සමග මූලික සාකච්ඡා | නැත | නැත |
| 23 | ගීසර වියන (සංගීතමය වැඩසටහන) | 8600.00 | නැත |
| 24 | මෘදු කුසලතාසංවර්ධන වැඩසටහන | 213,500.00 | නැත |
| 25 | වෘත්තීය මාර්ගෝපදේශණ දැනුවත් කිරීමේ වැඩසටහන | නැත | නැත |
| | **එකතුව** | **383,190.00** | **550000.00** |

# 20. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය

## 20.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මගින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්‍ෂණික සේවාව සහ තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන් සැපයේ. මේ මගින් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුවල කාර්ය මණ්ඩලය සහ බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා සේවය ලබාදෙයි. මෙම අංශය මගින් අධ්‍යයන කටයුතු සඳහා නොමඳ දායකත්වයක් ලබාදෙයි. එමගින් තොරතුරු තාක්ෂණ සක්‍යතාවල සුදුසු පරිසරාත්මක පසුබිමක් ඔස්සේ ලබාදෙන අතර අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සඳහා පරිගණක පහසුව සැපයේ.ඒ අනුව තොරතුරු තාක්ෂණයේ නවතම උපාංග භාවිතයෙන් සේවය සැපයීම සිදුකෙරේ. මෙම සේවාවන්ට විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පහසුකම්ල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාල නඩත්තුව ආදිය ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්ල විද්‍යුත් අධ්‍යයන ඇරඹුම් (ඉගෙනුම් ආධාරක පරිගණක ගත කිරීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති ) මෙමගින් සැපයේ. අධ්‍යයනාංශ සහ ඒකක සඳහා ඔවුන්ගේ තොරතුරු මාර්ගගත (Online) පද්ධතිය හරහා සැපයීම සිදු කෙරේ.

## 20.2 පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් /මෙහෙය වන ලද පාඨමාලා

- ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා ඩිප්ලෝමා සහ උසස් සහතික පත්‍ර පාඨමාලා මෙහෙයවීම.
- බාහිර අයදුම්කරුවන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (මුදල් අය කෙරේ)

## 20.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා පරිගණක විද්‍යාගාර පහසුකම්

මෙම මධ්‍යස්ථානය සඳහා පරිගණක විද්‍යාගාර තුනක් ඇත. මෙයින් විශාලතම විද්‍යාගාරයේ පරිගණක 40ක් අඩංගුවන අතර අනෙකුත් විද්‍යාගාර දෙකෙහි 20 බැගින් වන පරිදි පරිගණක පහසුව ඇත. මෙම විද්‍යාගාර පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වා සතියේ දිනවල විවෘතව තැබෙන අතර සෙනසුරාදා දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා විවෘතව පවතී.

## 20.4 අයවැය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන | - | 1.2 මිලියන |
| පුනරාවර්තන | - | 3.4 මිලියන |

## 20.5 කාර්යමණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 03 |
| පරිගණක යෙදුම් සහකාර | - 02 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| කාර්මික නිලධාරී | - 01 |

## 20.6 වර්ෂය තුළ ප්‍රගතිය

- පරිගණක රැහැන් ජාලය පුළුල් කිරීම
- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කටයුතු
- බාහිර සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලවන් ආරම්භ කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම

## 20.7 දුෂ්කරතාවන්

- කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රතිපාදන හිඟ වීම
- වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පරිගණක විද්‍යාගාර පුළුල් කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- මෙම මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත්තේ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන ඉතා පැරණි ගොඩනැගිල්ලකය

## 20.8 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

- මෙම ගොඩනැගිල්ල ඉතා පැරණි සහ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන හෙයින් කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරුතාක්ෂණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් අවශ්‍ය කෙරේ
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (Learning Management System) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වා දීම
- බාහිර පුද්ගලයන් සඳහා වැඩමුළු පැවැත්වීම
- පරිගණක විද්‍යාගාරයේ පුළුල් කිරීම් සිදු කරමින් වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට පහසුකම් සැපයීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- කාර්ය මණ්ඩල පුහුණුව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පරීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

## 20.9 වෙනත් අදාළ තොරතුරු

බහුසේවා මධ්‍යස්ථානයක් (Multi Service Centre) වශයෙන් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීම අවශ්‍ය වන අතර එමගින් විශ්වවිද්‍යාලයටත් බාහිර පාර්ශ්වයන්ටත් පුළුල් සේවාවන් සැපයිය හැකිය.

## 21. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

### 21.1 හැඳින්වීම

සිසුන්ගේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්‍ෂණ අභියෝගයන්ට මුහුණ දීමට හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාව මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මගින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්‍ෂණ හා උසස් පරිගණක භාවිතාව පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්‍ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්‍ෂණවල දී මෙම ඒකකය මඟින් සේවාව සැපයේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට පරිගණක තාක්‍ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා පවත්වනු ලැබේ. එමෙන්ම පළාතේ බාහිර ප්‍රජාවට ප්‍රයෝජනවත් වන පරිගණක තාක්‍ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මඟින් වඩාත් පුළුල් සේවාවක් සැපයේ.

මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘතව පවතී.

### 21.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2015 පෙබරවාරි මස DIT සහ CCAS ශිෂ්‍යයන් සඳහා "පරිගණක දෘඩාංග එකලස් කිරීම" පිළිබඳ එක්දින වැඩමුළුවක් මෙහෙය වීය.
- 2015 මැයි මස දී පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හත්වෙනි (07) ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු අවසන් කෙරිණි.
- 2015 දෙසැම්බර් මස වන විට තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවේ හතරවන (04) ශිෂ්‍ය කණ්ඩායම අවසන් කෙරිණි.
- පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව අටවෙනි (08) ශිෂ්‍ය කණ්ඩායම 2015 ඔක්තෝබර් මස දී ආරම්භ කෙරිණි.
- 2015 නොවැම්බර් මස දී තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවා සඳහා පස්වන (05) ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගන්නා ලදී.
- නව තොරතුරු තාකෂණ ඩිප්ලෝමාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ උපාධි අපේක්ෂකයන් සඳහා හඳුන්වා දෙන ලදී.

### 21.3 පර්යේෂණ කටයුතු

ඩබ් කේ ජී කේ එස් වීරසිංහ මහත්මිය **“Development of an online tool for teaching ornamental plant identification “** පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු කිරීම

## 21.4 කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 02 |
| පරිගණක යෙදුම් සහකාර | - 01 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| තාක්ෂණ නිලධාරි | - 01 |

•

## 21.5 අයවැය

මිලියන 1.0 ක මුදලක් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද අතර පරිගණක පද්ධතිය නඟා සිටුවීම සඳහා වැය කෙරිණි.

## 21.6 වසර තුළ ප්‍රගතිය

- පරිගණක තාක්ෂණ මධ්‍යස්ථානයේ පැරණි පුටු ඉවත් කොට අලුතින් පරිගණක පුටු 50ක් මිලදී ගන්නා ලදී
- අක්‍රීය වී තිබූ පරිගණකයක් වෙනුවට නව පරිගණකයක් මිලදී ගන්නා ලදී
- වැඩි වන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව මුද්‍රණ කටයුතු පුළුල් කිරීම සඳහා අලුතින් ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී
- වතුර උණු කිරීම සඳහා අලුතින් බොයිලේරුවක් මිලදී ගන්නා ලදී

## 21.7 බාධාවන්

- පරිගණක විද්‍යාගාර සඳහා භෞතික ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- අවශ්‍ය ප්‍රමාණයට දේශන ශාලා සහ කාර්ය මණ්ඩල කාමර පහසුකම් නොමැති වීම

## 21.8 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

වර්ග මීටර 2000ක ඉඩකඩක් සහිත ගොඩනැගිල්ලක් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කෙරේ.

## 22. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

### 22.1 දැක්ම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වීමය.

### 22.2 මෙහෙවර

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ මෙහෙවර වනුයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙන ගැනීම සම්බන්ධ තෝරාගත් ක්‍රමවේද මඟින් උපාධි අපේක්ෂකයින්ගේ භාෂා ප්‍රවීණතාව වැඩි දියුණු කිරීම.

- ඵලදායී ක්‍රමවේද මගින් කතාව, කියවීම, ලිවීම සහ සවන්දීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම.
- ශාස්ත්‍රීය, සමාජීය, හා වෘත්තීය ප්‍රජාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වීම සඳහා සිසුන් පෙළඹවීම.
- ජාතික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඵලදායි සන්නිවේදන කුසලතා ලබා දීම.

### 22.3 පසුබිම

කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මඟින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතාව ලබා ගැනීමටත්, ඔවුන්ගේ අවංකභාවය වැඩි දියුණු කර, අනුවර්තනීය සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් ලෙස රටට බිහිකිරීමත් අපේක්‍ෂා කරනු ලැබේ. ජාතික සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කිරීම මෙම පාඨමාලාව හැදෑරීම තුළින් අවස්ථාව උදාකරගත හැක. ශිෂ්‍ය කේන්ද්‍රගත ඉගැනුම් ක්‍රම හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට වැඩි අවස්ථාවක් ලබා දීමෙන් ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා සිසුනට උසස් බලාපොරොත්තුවක් ඇති කෙරේ.

### 22.4 කාර්යය මණ්ඩලය

**අධ්‍යයන කාර්යය මණ්ඩලය**

එම් කේ එස් එම් සමරනායක මහතා - සමායෝජක

ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා - කථිකාචාර්ය

ඩබ්ලිව් එස් ඒ ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය

කේ එම් දිසානායක මහතා - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු ලබා සිටියි)

**තාවකාලික උපදේශකවරු**

එන් පී සී ජේ විජේවර්ධන මෙය

ආර් ඩී එල් ජී සිරිවර්ධන මෙය

ඩී එස් අනූපමා මෙය

ජී එම් සී එම් දයානන්ද මෙය

**අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

ඩී ජී ආර් එම් විජේසිංහ මෙය (පරිගණක යෙදුම් සහකාර)

ඩබ්ලිව් පී ඩී සිරිවර්ධන මයා (කාර්යාල කම්කරු)

## 22.4 2015 වසරේදී පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

**I) ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා**

- නවක සිසුන් සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව.
- පළමු වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව.
- දෙවන වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව.
- තුන්වන වසර සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- තුන්වන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා උසස් මට්ටමේ ප්‍රවීණතා පාඨමාලාව.

**II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**

- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි I ව්‍යාකරණ පදනම් පාඨමාලාව (ELTU 1110)
- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි II ලේඛන පාඨමාලාව (ELTU 1210)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

## 22.5 බාහිර පාඨමාලා

### 22.5.1 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව -09 වන කණ්ඩායම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් මෙහෙයවනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ 09 වන කණ්ඩායම සඳහා 2015 වසරේදී සිසුන් 305 දෙනෙක් ලියාපදිංචි කරන ලදී. එසේම 08 වන කණ්ඩායමේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2015.09.11 වන දින විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. ඩිප්ලෝමා ලාභීන් 193 දෙනෙක් සහතික පත්‍ර උපකුලපති තුමා මගින් ලබාගත්හ.

### 22.5.2 විශේෂ පාඨමාලා

අනධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් සඳහා සහකාර ලේඛකාධිකාරී විභාගයට සූදානම් වීමේ පාඨමාලාවක් පැවැත්විණි. මේ සඳහා විශේෂ පංතියක් ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා විසින් පවත්වන ලදී.

### 22.5.3 ඉංග්‍රීසි දින තරඟ

2015 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල දී වාර්ෂිකව පැවැත්වෙන ඉංග්‍රීසි දින තරඟ පවැත්විණි. මේ සඳහා පීඨ හතර නියෝජනය කරමින් සිසුන් සාමානය දැනීමේ තරඟ, නිර්මානාත්මක ලේඛනය, ගායනය සහ කථික තරඟ පැවැත්විණි.

### 22.5.4 බිත්ති පුවත්පත

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ බිත්ති පුවත්පත (oracle) දෙවැනි අදියර 2015.10.01 දින එළි දක්වන ලදී. මේ සඳහා සිසුන්ගේ නිර්මාණ 30කට ආසන්න ප්‍රමාණයක් ඉදිරිපත් විය.

### 22.5.5 ආදර්ශ සම්මුඛ පරීක්ෂණ

ව්‍යාපාර ඉංග්‍රීසි පාඨමාලාව හදාරන ලද සිසුන් සඳහා ආදර්ශ සම්මුඛ පරීක්ෂණ (mock interviews) 2015.12.15 දින ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දී පැවැත්විණි. ප්‍රදේශයේ ආයතනවල කළමනාකරුවන් සහ විධායක නිලධාරීන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා සහභාගි විය.

## 22.6 කාර්යමණ්ඩල ජයග්‍රහණ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා ඩබ් එස් ඒ ප්‍රනාන්දු මහත්මිය  උපාධි නිබන්ධය බාරදුන්නාය.

## 22.7 ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්

කථිකාචාර්ය එම් කේ එස් එම් සමරනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යා ජාත්‍යන්තර පර්යේෂණ සැසිය සඳහා පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

## 22.8 පත්වීම්

- එම් කේ එස් එම් සමරනායක මහතා 2015.09.03 දින සිට ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ සම්බන්ධීකාරක ලෙස පත්කරන ලදී.
- ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා 2015.09.16 දින සිට ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.
- ඩබ් එස් ඒ ප්‍රනාදු මහත්මිය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස 2015.10.01 දින සිට පත්කරන ලදී.
- 2015.06.01 දින සිට 2015.12.31 දින දක්වා එම් කේ එස් එම් සමරනායක මහතා UTEL පාඨමාලාවේ සම්බන්ධීකාරක ලෙස පත්කරන ලදී.

# 23. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

## 23.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පිහිටි පීඨ දෙකෙහි පළමු දෙවන සහ තෙවන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා මෙම ඒකකය මගින් පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව පැවැත්විණි. "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා පැවැත්විණි. "අධ්‍යයන ලේඛනය" පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා පැවැත්විණි. එසේම පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වන ලදී. ව්‍යාපාරික ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන සහ තුන්වන වසර සිසුන් සඳහා පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලා සාර්ථක අන්දමින් පවත්නා ලද අතර එය පීඨ දෙකෙහිම 2014 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා ක්‍රියාත්මක විය.

## 23.2 පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන්

මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකට අයත් සිසුහු ඉංග්‍රීසි දින තරග සඳහා සහභාගි වූහ. කෙටි කාලීන් ඉංග්‍රීසි පාඨමාලාව සඳ'හා බඳවා ගන්න ලද ඉංග්‍රීසි උපදේශකයන් සම්බන්ධීකාරක විසින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේද භාවිත කරමින් පුහුණුකරන ලදී. මේ යටතේ ඉගැනුම් ක්‍රියාවලියේ භාවිතයන් පිළිබඳව සාකච්ඡා කිහිපයක් පැවැත්විනි. කාර්යමණ්ඩලයේ දැනුම සහ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා පවත්වනු ලබන රැස්වීම් ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේදී පැවැත්විණි. e-learning මගින් ඉංග්‍රීසි ඉගැනීමේ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා පස්වන ශිෂ්‍ය කණ්ඩායම ඔක්තෝබර් මසදී බඳවා ගන්නා ලදීග සම්බන්ධීකාරක තුමිය තායිලන්තයේ තාක්ෂණය පිළිබඳ ආසියානු ආයතනය මගින් මෙහෙය වන ලද කළමනාකරණ වැඩසටහන සඳහා 2015 මැයි මස 10 - 17 දිනයන්හි දී සහභාගී විය.

## 23.3 කාර්යය මණ්ඩල තත්වය

මාකඳුර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ එක් ස්ථිර ඉංග්‍රීසි උපදේශිකාවක් සහ තාවකාලික ඉංග්‍රීසි උපදේශකවරු හතරදෙනෙකුගෙන් සමන්විත වේ. එසේම එක් බාහිර ඉංග්‍රීසි උපදේශකවරයෙකුගේ සේවය ද ලබා ගැනේ. ඊට අමතරව පරිගණක යෙදුම් සහකාරවරයෙක් සහ කම්කරු ශ්‍රේණියේ සේවක මහතෙක් සිටිති.

මෙම පරිගණක යෙදවුම් සහකාර තනතුර සහ කම්කරු තනතුර සඳහා රාජකාරි ලැයිස්තුවක් (Duty List ) සකසා දී ඇති අතර එය ලේඛකාධිකාරී කාර්යාලයේ උපදෙස් පරිදි සිදුවිණි.

## 23.4 ගත වූ වර්ෂයේ ප්‍රගතිය

පීඨ මට්ටමින් ඉංග්‍රීසි දින තරග පවත්වන ලද අතර එමඟින් විශ්වවිද්‍යාල මට්ටමින් තරග සඳහා ඉදිරිපත් වීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම සිදු විය. විශ්වවිද්‍යාල මට්ටමේ තරග පැවැත්විණි. මෙම තරගයේ දී මෙම සිසුන්හට ස්ථානයක් ලබා ගැනීමේ හැකියාව ලැබුණි. සහතික පත්‍ර ප්‍රදානය මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. සියලු ඉංග්‍රීසි වැඩසටහන් සාර්ථකව පැවැත්විණි. e-learning මඟින් ඉංග්‍රීසි ඉගෙනීමේ සහතික පත්‍ර පාඨමාලාව පස්වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. එදිනම e-learning පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය ද සිදු කෙරිණි.

## 23.5 බාධාවන්

ඉංග්‍රීසි ඉගැන්වීමේ අංශය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයේ හිඟය ප්‍රධාන බාධාවක් ලෙස පෙන්වා දිය හැකිය.

## 23.6 යෝජනා

මාකඳුර පරිශ්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය සඳහා ස්ථිර අචාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. අංශයේ උපදේශකයින් සඳහා තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතුය.

# 24. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වේ. එයින් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපිත වී ඇති අතර අනෙක මාකඳුර පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත. මෙමගින් 2015 වර්ෂය තුළ දී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. 2014 වර්ෂයේ මෙන්ම 2015 වර්ෂයේදීද කුලියාපිටිය පරිශ්‍රයේ කාර්ය මණ්ඩලය සාත්තු සේවකයකු, මහජන සෞඛය පරීක්ෂකවරයකු, ඖෂධවේදියෙකු, ලඝු ලේඛිකාවක සහ කම්කරුවෙකු ගෙන් සමන්විත විය. මාකඳුර පරිශ්‍රයේද ලඝු ලේඛිකා තනතුර හැර අනෙකුත් තනතුරු සමානව ඇත.

**වෛද්‍ය පරීක්ෂණ**

විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී විසින් අලුතෙන් පත්කරන ලද කාර්ය මණ්ඩලයේ සහ සේවා දීර්ඝ කිරීම් අවශ්‍ය වන කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය නිර්දේශයන් ලබාදීම සිදු විය.

සුළු අසනීප සඳහා කාර්යමණ්ඩලයට සහ ශිෂ්‍ය ප්‍රජාවට ප්‍රතිකාර කිරීම වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් සිදු විය.විශේෂ වෛද්‍ය අවධානයක් අවශ්‍යවන අය සඳහා කුලියාපිටිය මූලික රෝහල වෙත යොමු කිරීම සිදු විය.

2015 වර්ෂය තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් බොහොමයක් සිදු කෙරිණි.

1. බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් සහ සුවනාරි සායනයන් පැවැත්වීම
2. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යකරණයට ලක් කිරීම
3. මදුරු මර්ධන වැඩසටහන්
4. ජලබීතිකාව සඳහා එන්නත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය
5. වාර්ෂික අහාර සහ ජල සාම්පල පරීක්ෂා කිරීම
6. 2015 දෙසැම්බර් මසදී විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් සඳහා පියයුරු ආශ්‍රිතා රෝග හඳුනා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වියග
7. ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් සහ ලිංගිකව බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම

සාමාන්‍යයෙන් 2015 වර්ෂය තුළ කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයන්හී සීමාවන්ට යටත්ව කණ්ඩායමක් ලෙස සමස්ත විශවවිද්‍යාල ප්‍රජාව සඳහාම උපකාර කිරීමට වෛද්‍ය නලධාරී ඇතුළු කණ්ඩායමට හැකියාව ලැබුණි

## 25. පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2014 රු. | 2015 රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 467,368,504 | 580,380,222 |
| ආ. ගමන් වියදම් | 3,691,942 | 6,868,077 |
| ඇ. සැපයීම් | 35,804,775 | 32,813,321 |
| ඈ. නඩත්තු | 12,219,804 | 13,712,910 |
| ඉ. කොන්ත්‍රාත් සේවා | 120,510,792 | 128,079,912 |
| ඊ. වෙනත් | 28,229,796 | 254,697,069 |
| **එකතුව** | **670,825,613** | **1,016,551,511** |

## 26. ප්‍රාග්ධන වියදම් තොරතුරු

| විෂය | 2014 රු. | 2015 රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 123,843,857 | 95,373,337 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම් | - | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | - | - |
| ඈ. ඉඩකඩම් අත්පත්කර ගැනීම් | 7,000,000 | - |
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වාර්ථාව 2016 නොවැම්බර් පැවති පාලක සභාවට යොමු කර එම පිරිවැය ගිණුම්ගත කිරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත.

9. වාහන

විශ්වවිද්‍යාලය සතු වාහන ප්‍රත්‍යාගණන වාර්තාව ඔක්තෝබර් මස පැවති 171 වන පාලක සභාවට යොමු කරන ලදී. (Memo 171/62)

10. ගොඩනැගිලි ජල සැපයුම් පද්ධතිය

පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති තුමන් විසින් ප්‍රත්‍යාගණන කමිටුවක් පත්කර ඇති අතර ප්‍රත්‍යාගණන කටයුතු අවසන් වී නොමැත.

**භෞතික සමීක්ෂණ වාර්තා**

2015 වර්ෂය සඳහා සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාළ භෞතික සමීක්ෂණ වාර්තා රජයේ විගණන අංශය වෙත ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. **(ඇමුණුම - 01)**

**2.3 <u>නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>**

**(අ)** ඉදිරියේදී පාලක සභා අනුමැතිය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** ඒ ඒ ස්වයං මූල්‍ය පාඨමාලාවලට අදාල ව්‍යවස්ථාවන්ට (by-law) අනුකූලව පාඨමාලා කටයුතු මෙහෙයවනු ලැබේ. වෙනත් බැරකම් යටතේ පෙන්වා ඇති ස්වයං මූල්‍ය පාඨමාලා බොහොමයක් මේ වන විට අවසන්කර නොමැති පාඨමාලාවන්ට අදාලව ලැබුණු අරමුදල් වේ. කෙසේවෙතත්, අවසන් කර ඇති පාඨමාලාවල අතිරික්ත මුදල් පිළිබඳ අදාල පාඨමාලා ව්‍යවස්ථානුකූලව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

**(ඇ)** ආයතන සංග්‍රහයේ (IX) වැනි පරිච්ඡේදයේ 2.2 ඡේදයට අනුව රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් විසින් කාර්යාල වේලාව තුළ දී ම කාර්යාලයීය නොවන වැඩ ඉටු කිරීම වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් 10% ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. මේ වන විට ඒ බව අදාල පත්වීම් ලිපියේ සඳහන් කරනු ලැබේ. **(ඇමුණුම - 02)**

**(ඈ)** කුලියාපිටිය ප්‍රධාන ගබඩාවේ සහ මාකඳුර උප ගබඩාවල පැවති භාවිතයට ගත නොහැකි භාණ්ඩ 2016 ඔක්තෝම්බර් මස අපහරණය කිරීමට කටයුතු කරන ලදී.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**(අ) විවිධ ණයගැතියෝ රුː17,932.08**

CARP (Council for Agricultural Research Policy) ආයතනය මගින් ලබාදී තිබූ පර්යේෂණ ව්‍යාපෘතියක් යටතේ 2007 වර්ෂයේදී වැඩිපුර වියදම් වී ඇති රුː17,932.08 ක මුදල ණයගැතියෝ ලෙස 2008 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත.

**ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු රුː 261,867.00**

මෙම නේවාසිකාගාර හිඟ ගාස්තු සිසුන්ගෙන් අය කර ගනු ලබන්නේ ඔවුන් විසින් විශ්වවිද්‍යාල උපාධි සහතිකය ගනු ලබන අවස්ථාවේදීය. සමහර සිසුන් විසින් උපාධි පාඨමාලාව අවසන් නොකරන බැවින් එම සිසුන්ගේ හිඟ ගාස්තු අය කර ගැනීමට නොහැකි අතර 2015 වර්ෂය සඳහා ඉදිරිපත් වූ උපාධි සහතික ඉල්ලුම්පත්‍ර වලට අදාලව අයකරගත යුතුව තිබූ මුදල් අය කර ගැනීමට පියවර ගන්නා ලදී.

**(ආ)**

| ලෙජර් ගිණුම් අංකය | වීස්තරය | ගිණුමේ ශේෂය (රුː) | |
|---|---|---|---|
| 133011 | I.U.C.N. Project | 55,201.15 | * |
| 133108 | Research Grant (MPPA) | 69,778.00 | * |
| 135013 | Technical Assistant to SHRIMP FARM | 40,000.00 | ** |
| 135024 | ELTU - Makandura | 446,617.98 | *** |
| 135028 | Biotechnology | 18,657.18 | * |
| 135031 | Castor Project | 61,793.84 | ** |
| **එකතුව** | | **691,987.00** | |

*මෙම ව්‍යාපෘතිය යටතේ ඉතිරිවී තිබුණ අරමුදල් මේ වන විට අදාළ කාර්යයන් සඳහා යොදවා ඇත.

** මෙම ව්‍යාපෘතිය යටතේ ඉතිරිවී ඇති අරමුදල් පිළිබඳව තීරණයක් ගැනීම සඳහා අදාල ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත.

*** අදාල ව්‍යාපෘති කටයුතු අවසන් වී ඇති බැවින් මෙම මුදලින් මාකඳුර ඉංග්‍රීසි ඒකකය සඳහා පරිගණක මිලදී ගැනීමට උපකුලපති අනුමැතිය ලබා දී ඇත.

| පිටු අංකය | ගෙවිය යුතු ගිණුම | ලෙජර් ගිණුම් අංකය | 2015/12/31 දිනට ශේෂය (රුː) | |
|---|---|---|---|---|
| 36 | විවිධ ණය හිමියෝ - මාකඳුර | 162001 | 12,500.00 | මෙම සෘජු ලැබීම් හඳුනාගත නොහැකි වී ඇති අතර විශ්වවිද්‍යාලයේ අදායම් ලෙස ගිණුම්ගත කිරීමට 2016 නොවැම්බර් මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇත. (FC102-10) |
| 38 | සැපයුම් ණයහිමියෝ | 162002 | 21,909,041.00 | රුː 439,089.28 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |
| 39 | විවිධ ණයහිමියෝ | 162003 | 531,068.00 | මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කරමින් පවතී. |
| 40 | කොන්ත්‍රාත් රඳවාගැනීම් | 166001 | 3,421,708.00 | මෙම මුදලින් 540,035.99 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |
| 42 | ටෙන්ඩර් තැන්පතු | 16101001 | 107,220.00 | මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කරමින් පවතී. |
| 43 | ආරක්ෂක තැන්පතු | 16101002 | 1,563,223.00 | මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කරමින් පවතී. |
| 45 | නොගෙවූ මහපොළ | 16101005 | 1,230,650.00 | රුː 29,500.00 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |
| 44 | නොගෙවූ ශිෂ්‍යාධාර | 16101004 | 68,500.00 | ශේෂය රුː 68,300.00 ‍ක් ලෙස නිවැරදි විය යුතුය. රුː 63,300.00 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |
| 46 | ආරක්ෂක තැන්පතු - මාකඳුර | 16101008 | 44,200.00 | රුː 34,200.00 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |
| 47 | ආපසු ගෙවිය යුතු තැන්පත් | 16101009 | 14,000.00 | ශේෂය රුː 13,000.00 ‍ක් ලෙස නිවැරදි විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 29 (ACC Book) | පුස්තකාල තැන්පත් | 16103001 | 5,000.00 | පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගෙන් ලබාගෙන ඇති පුස්තකාල තැන්පතු වන අතර අදාල අධ්‍යයන කටයුතු නිමකල පසු ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. |
| | | | 28,907,110.00 | |

ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්වල සඳහන් වන රු:28,907,110.00 ක මුදලින් රු:26,864,255.00 ක මුදල 2015 වර්ෂයට අදාල වේ. මෙම ගෙවිය යුතු ගිණුම් බොහොමයක් මේ වන විට නිරවුල් කර ඇති අතර වසර ගණනාවක සිට පැවත එන ශේෂයන් වහාම නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

**(ඇ) මාකඳුර කෘෂි පීඨය දෙවන අදියර**

මෙම බිල්පත් 2016 වර්ෂයේ වවුචර් අංක C222 මගින් ගෙවීම් කරන ලදී.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය -1 අදියර**

මෙම බිල්පත් 2016 වර්ෂයේ වවුචර් අංක C345 මගින් ගෙවීම් කරන ලදී.

**(ඈ)** පුස්තකාල පොත් හා වාර සඟරා මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වයඹ මණ්ඩපය ලෙස පැවති කාලයේ (1996-1999) ලබාදී ඇති මෙම අත්තිකාරම් ගෙවීම් පිළිබඳ සියළු ලිපි ලේඛණ සොයා ගැනීමට අපහසු වී ඇති නිසා නොපියවූ මූලධන අත්තිකාරම් ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

54 වන විගණන කමිටු නිර්දේශය පරිදි මෙම අත්තිකාරම් මුදල් රෙගුලාසි 108 අනුව කපා හැරීම සඳහා උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත 2016.09.26 දිනැති ලිපිය මගින් අනුමැතිය ඉල්ලා ඇත. 2016/02/12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2016 හි උපදෙස් පරිදි කටයුතු කරන ලෙසට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් 2016/10/27 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. **(ඇමුණුම- 03)**

**(ඉ)** 2.4 **(ආ)** පිළිතුර අදාළ වේ.

03. <u>මූල්‍ය සමාලෝචනය</u>

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.

## 4. <u>මෙහෙයුම් සමාලෝචන</u>

### 4.1 <u>කාර්ය සාධනය</u>

**ව්‍යවහාරිකවිද්‍යා පීඨය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013/2014 අධ්‍යයන වර්ෂයට අදාලව ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා බඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන සිසුන් සංඛ්‍යාව පිළිබඳව විමසීමෙන් පසුව එම අධ්‍යයන වර්ෂයට අදාලව ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා සිසුන් 200 ක ප්‍රමාණයක් බඳවා ගැනීමට අපේක්ෂා කරන බව ඊට පිළිතුරු වශයෙන් දන්වන ලදී.

ඒ අනුව, 2013/2014 අධ්‍යයන වර්ෂයට අදාලව ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා සිසුන් 200 ක් බඳවා ගැනීමේ අරමුණින් ඊට අදාළ සියලු කටයුතු ශිෂ්‍ය බඳවා ගැනීමේ සුබසාධන අංශය විසින් සිදු කරන ලදී. ශිෂ්‍ය බඳවා ගැනීමේ සහ සුබසාධන අංශය විසින් පීඨය වෙත දන්වන ලද දත්තයන් අනුව 2015/02/19 දින වන විට එම අධ්‍යයන වර්ෂයට අදාලව ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා පියවර හතරකදී (පළමුවෙන්ම සිසුන් ලියාපදිංචි වන අවස්ථාව සහ පුරප්පාඩු පිරවීමේ අදියර 03 ක්) සිසුන් 205 ක් බඳවාගෙන තිබූ බැවින් සහ එම සිසුන් සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කර තිබූ බැවින් ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා අපේක්ෂා කරන ලද සිසුන් ප්‍රමාණය බඳවාගෙන අවසන් බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කරන ලදී.

කෙසේවුවද, 2013/2014 අධ්‍යයන වර්ෂයට අදාලව අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිසුන් වෙනත් විශ්වවිද්‍යාල සඳහා මාරු කර යැවීම හේතුවෙන් බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවෙහි අඩුවීමක් දක්නට ලැබෙන අතර පුරප්පාඩු පිරවීමේ ක්‍රමවේදයේ පවතින යම් යම් දුර්වලතාවයන් හේතුවෙන් අධ්‍යයන කටයුතු ආරම්භ වීමෙන් සැලකිය යුතු වූ කාලයක් තුළ දී එලෙස ඇති වූ පුරප්පාඩු පිරවීම සිදු නොවන ලදී. අධ්‍යයන වර්ෂය අතරමගදී නවක සිසුන් නැවත නැවත බඳවා ගැනීම අධ්‍යයන පාඨමාලාවේ ගුණාත්මක භාවයට අහිසි ලෙස බලපාන බැවින් සහ එම නවක සිසුන්ට පාඨමාලාවේ කොටසක් මඟ හැරෙන බැවින් එමඟින් ඇති වූ පුරප්පාඩු සංඛ්‍යාව එලෙසම පවත්නා ලදී.

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආරම්භයේදී අපගේ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් හට, පසුව වෙනත් උපාධි පාඨමාලාවලට ඇතුළුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අවස්ථාව ලබාදීමත්, ඒ බව සෑප්‍රුවම සිසුන් වෙත දැනුම්දීමත් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. පීඨවල මෙසේ ඇතිවන පුරප්පාඩු පිරවීම ද කොමිෂන් සභාව යටතේ සිදුවේ. මෙම ක්‍රියාවලිය අපට පාලනය කළ නොහැක.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

**(අ)** 2014 වර්ෂයේ ඉදිකිරීම් නිම කර බාර දී ඇති නේවාසිකාගාර මේ වන විට සිසුන් හට ලබා දී ඇති අතර කුලියාපිටිය පරිශ්‍රයේ එක් නේවාසිකාගාරයක් නොබෝ දිනකින් සිසු අයිතියට පත් කිරීමට නියමිතව ඇත.

තට්ටු ඇඳන් කඩිනමින් ලබා දීමට නොහැකි වූයේ, ඒවා පළමුව දැව වලින් සකස් කල යුතු බවට තීරණය වී පසුව නැවතත් වානේ වලින් නිෂ්පාදනය කල යුතු බවට තීරණය වීම නිසා ය.

**(ආ)** 2016/11/11 දින මේ සම්බන්ධයෙන් සියලුම පාඨමාලා අධ්‍යක්ෂකවරුන්, පරිපාලන සහ මුදල් සමායෝජකවරුන් සමඟ සාකච්ඡා කරන ලද අතර සියළුම පාඨමාලා සඳහා වෙන වෙනම පොත් පත් පවත්වාගෙන යන බව දැනුම් දෙන ලදී. තවද, සෑම පාඨමාලාවක් සඳහාම සිසුන්ට විභාග වලට පෙනී සිටීමට ඉඩ දීමේදී සහ අවසානයේ සහතික පත්‍ර ප්‍රදානය කිරීමේදී සම්පූර්ණ ගාස්තු ගෙවා ඇත්ද යන්න පරීක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී. අවශ්‍යනම්, පරීක්ෂා කිරීම සඳහා පාඨමාලාවල පවත්වාගෙන යන පොත් පත් අදාල පරිපාලක සමායෝජකවරුන්ගෙන් ලබා ගත හැකි බැව් කරුණාවෙන් දන්වමි.

**(ඇ)** **<u>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය</u>**

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් පීඨ කාර්යාලය මගින් විධිමත් පැමිණීමේ ලේඛණයන් පවත්වාගෙන යනු ලබයි. බාහිර කථිකාචාර්යවරයාගේ සේවය ලබා ගන්නා අදාල දෙපාර්තමේන්තුව මගින් එම ලේඛණයේ නිසි පරිදි අදාල බාහිර කථිකාචාර්යවරයාගේ පැමිණීම සහ පිටවීම සටහන් කරගන්නා අතර ඒ අනුව ඔවුන්ගේ ගෙවීම් කටයුතු සිදු කෙරේ. තවද, මෙම පීඨයේ 2014 වසර තුළ එසේ අනුමත දේශන හා ප්‍රායෝගික පැය ගණන සහ ඉටු කළ පැය ගණන අතර වෙනස්කම් නොමැත.

**පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය**

**ආචාර්ය බන්දුල රණවීර මහතා**

ආචාර්ය බන්දුල රණවීර මහතාට LFN 1324 විෂය යටතේ සිද්ධාන්ත දේශන පැය 35 ක් හා ප්‍රායෝගික පැය 30 ක් ලබා දී තිබුණි. ඉන් සිද්ධාන්ත දේශන පැය 35 ක් සහ ප්‍රායෝගික පැය 30 න් කොටසක් ඔහුගේ උපදෙස් මත ක්ෂේත්‍ර චාරිකා මගින් ඉටු කරන ලද අතර ඉතිරි කොටස් අදාල අධ්‍යයන අංශයේ තාවකාලික ප්‍රදර්ශක හා සහකාර කථිකාචාර්ය කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් සිදුකරන ලදී.

**ආචාර්ය මධුජිත් ටෙරන්ස් මහතා**

**ඇමුණුම** 04

**ආචාර්ය ජේ.සී. එදිරිසිංහ මහතා**

ආචාර්ය J.C එදිරිසිංහ මහතා විසින් ප්‍රථමයෙන් පැය 15 ක් සඳහා අනුමැතිය ලද LFN 3222 විෂය පැය 30 ක් දක්වා ඉගැන්වීම සිදුකරන ලද්දේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ඉල්ලීම පරිදිය.

**ආචාර්ය D.A.M. පෙරේරා මයා**

ආචාර්ය D.A.M. පෙරේරා මයා හට Principles of Food Marketing and Business Economics විෂය ඉගැන්වීම සඳහා පැය 30 ක් වෙන් කර තිබූ අතර ඉන් පැය 7.5 ක් අඩුවෙන් සිදු කිරීමට සිදු වූයේ පහත සඳහන් කරුණු නිසාවෙනි.

- එම වසරේ දේශන ආරම්භ වූයේ 2014 අප්‍රේල් 21 වැනි දින වන අතර 2014 අගෝස්තු 08 වැනි දින දේශන අවසන් කර ඇත. එම සති 15 න් mid – semester examination සහ presentation වැනි කරුණු හේතුවෙන් සති කීපයක්ම දේශන සඳහා අහිමි විය.

- තවද, දේශන පැවැත්වූ සෑම දිනකම පැය 1/2 ක් පමණ ඔවුනට වැඩිපුර උගන්වා ඇති අතර එය දේශන වාර්තා පොතේ සඳහන් කර නැත.

- මෙම විෂයේ ඇති ප්‍රායෝගික බව හේතුවෙන් දේශන වලට අමතරව ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට ඔවුන් යොමු කර එම දැනුම ලබා දීමට ක්‍රියා කළ අතර එම කාලය ද සටහන් කර නැත.

**(ඈ)** පශු සම්පත් සංවර්ධන වැඩසටහන (Livestock Development Project) යටතේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පශු සම්පත් හා පක්ෂි විද්‍යා දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද මෙම කාර්යය සඳහා භාණ්ඩ විශ්වවිද්‍යාලයට ලද බවටත් ඒවා එම කාර්යය සඳහා යොදවා ගත් බවට මාකඳුර වැඩ පරීක්ෂක විසින් නිර්දේශ කර ඇති අතර අංශ ප්‍රධානගේ සහ පීඨාධිපති අනුමැතිය යටතේ ගෙවීම් කර ඇත.

**(ඉ)** **විශ්වවිද්‍යාලයේ ඉඩම් හිමිකාරීත්වය**

**(i)** පිඹුරු අංක 992 හි කැබලි අංක 452 දරණ "බක්මීගහකුඹුර" නැමති ඉඩමට අදාල පැවරුම් නියෝගය රජයේ විගණන අංශයට ලබා දී ඇත.

පිඹුරු අංක 4490 අංක 1,2,7- වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් විසින් වයඹ විශ්වවිද්‍යාලයේ යෝජිත ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම සඳහා ''බෝගහඕවිට'' නැමැති ඉඩම වයඹ විශ්වවිද්‍යාලයට භුක්තිය සඳහා පවරා දී තිබුණ ද, නීත්‍යානුකූලව මෙම ඉඩම විශ්වවිද්‍යාලයට පවරා දී නොමැති බැවින් පැවරුම් සහතිකයක් නිකුත් කර නැත.

පිඹුරු අංක 10661- පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් අක්කර 5 පමණ වන මෙම ඉඩම භුක්තිය සඳහා විශ්වවිද්‍යාලයට පවරා දී තිබුණ ද, නීත්‍යානුකූලව මෙම ඉඩම විශ්වවිද්‍යාලයට පවරා දී නොමැති බැවින් පැවරුම් සහතිකයක් නිකුත් කර නැත. දැනට පවරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.

**(ii)** මාකඳුර පරිශ්‍රයේ පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් අක්කර 5 පමණ වන මෙම ඉඩම විශ්වවිද්‍යාලයට පවරා ගැනීම වෙනුවෙන් ගෙවා ඇති රුː මිලියන 10 ක මුදල ආපසු ලබාදීමට නෛතික පසුබිමක් නොමැති බව පොල් පර්යේෂණ මණ්ඩලය විසින් දන්වා තිබූ අතර, එය විකිණීමක් නොව තක්සේරුව අනුව සංවර්ධන වටිනාකම ලබාගැනීමක් බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක :MPI/DEV3/01/Wayamba/04 හා 2016.03.21 දිනැති ලිපිය මගින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. එහෙත්, මේ වන විට විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකර ඇති බැවින්, මෙම ඉඩම වයඹ විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා දෙන ලෙස අප විසින් 2016.04.20 දිනැති ලිපිය මගින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා සිටින ලදි. **(ඇමුණුම- 05)**

**(iii)** මේ වන විට ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

**4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

සතුන් රැඳවීමට අවශ්‍ය මූලික පහසුකම් වන විදුලිය, ජලය, ආරක්ෂිත වැට, රාත්‍රී කාලයට ආරක්ෂක නිලධරයකු සහ ආරක්ෂක කුටියක් ආදී අත්‍යවශ්‍ය අංග මෙතෙක් සම්පූර්ණ වී නොමැති බැවින් ගොවිපලක් ලෙස භාවිතා කල හැකි මට්ටමට ගොවිපලේ ඉදිකිරීම් තවමත් නිම වී නොමැත. එබැවින්, ඉහත අංග සම්පූර්ණ වූ දිනක වැඩ නිම වූ බවට දැනුම් දීමට බලාපොරොත්තු වෙමි.

කෙසේවෙතත්, 2016.02.11 දින සිට මෙම සත්ව ගොවිපල සඳහා ආරක්ෂක නිලධාරියකු ලබා ගැනීමට හැකි විය. සතුන්ගේ පැවැත්මට අත්‍යාවශ්‍ය සාධකයක් වන ජලය තවමත් ලැබී නැතත් ආරක්ෂක නිලධාරියා පත් වූ දින සිටම ගොවිපල තුල සතුන් ගාල්කර ගොවිපල පවත්වාගෙන යනු ලබයි. දිනපතා ජලය සපයා ගනු ලබන්නේ පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශයේ රාජකාරීයේ යෙදී සිටින අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධන හා ශ්‍රම භාවිතයෙනි.

අත්‍යාවශ්‍ය අංග සම්පූර්ණ වී නොතිබුණ ද, ආරක්ෂක නිලධාරීවරයෙකු අනුයුක්ත කළ දින සිට සත්ව ගොවිපල ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**(අ)** මෙම කොන්ත්‍රාත් කාර්යයන් 5 සඳහාම කාල ප්‍රමාදයන් සඳහා බලපාන ලද කරුණු පිළිබඳ නිර්දේශ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ලබා දී එම කොන්ත්‍රාත් සඳහා කාල දිගුවක් ලබා දී තිබුණි.

බිල්පත් ගෙවීමේදී සිදුවන ප්‍රමාදයන් සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු පොළිය වෙනුවට දින දීර්ඝයන් ලබා දීම්, වර්ෂා දිනයන්, ව්‍යාපෘති ඉංජිනේරු විසින් ලබා දිය යුතු වන උපදේශයන් සහ නිර්මාණ ලබාදීමේ ප්‍රමාදයන් සහ වෙනස් කිරීම් මේ සඳහා බලපා තිබුණි.

**(ආ) (i), (ii), (iii)**

මෙම ආපනශාලා ව්‍යාපෘතිය ඉතා කුඩා ව්‍යාපෘතියක් ලෙස වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට කඩිනමින් පහසුකම් සැපයීම සඳහා සැලසුම් කරන ලද අතර පළමු අවස්ථාවේදී, ව්‍යාපෘති උපදේශක විසින් ලබා දුන් වර්ග අඩි 8,392 න් යුතු ආපන ශාලාවක් මිලියන 45 ක දළ ඇස්තමේන්තුව යටතේ ඉදිකිරීමට අනුමැතිය ලැබී තිබුණි.

පසුව අවට පවතින ගොඩනැගිලි හමුවේ සීමිත ඉඩකඩ කළමනාකරණය කල යුතු බැවින් සහ අනාගතයේදී මෙම ආපන ශාලාව තව දුරටත් දියුණු කරමින් දිගු කල යුතු වන බැවින් ව්‍යාපෘති උපදේශක විසින් වර්ග අඩි 7,984 කින් යුතු පළමු මහලක් සහ වර්ග අඩි 7,984

කින් යුතු දෙවන මහලක් ලෙස යෝජනාව වර්ධනය කරමින්, සංවර්ධන අදියර 3 කින් ආපන ශාලාව සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී. මුළු වර්ග අඩි ප්‍රමාණය 15,968 ක් විය.

මෙහිදී පළමු ඇස්තමේන්තුව සඳහා වූ ඇස්තමේන්තුගත මුදලට වඩා දෙවන මහලක් සඳහා උචිත වන සේ පළමු මහලේ **Slab** ශක්තිමත් කිරීම, අත්තිවාරම් ශක්තිමත් කිරීම සහ මුල් ඇස්තමේන්තුවෙහි නොපැවති පඩිපෙළ සහ පඩිපෙළට අත්වැටක් සඳහා ද, ආපන ශාලාවට බද්ධ වූ ආපනශාලා උපකරණ **(In Built Kitchen Equipment)** සඳහා ද ඉතා විශාල අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය.

කෙසේවෙතත්, මෙම අතිරේක වියදම් සහිතව මෙම කොන්ත්‍රාත්තුව වර්ග අඩි 11,872 ක ප්‍රමාණයක් නිමකර ඇති අතර, ගෙවීම් අවසානයේ පවතින ඉතිරියෙන් තව දුරටත් දෙවන මහල සංවර්ධනය සඳහා ද කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, රුපියල් මිලියන 45 ක ප්‍රමාණයක් තුල වර්ග අඩි 8932 ක ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර ඇති අතර, අනුමැතිය ලබා දී තිබුණ වියදම් සීමාව ඉක්මවා නොමැති බව කාරුණිකව දන්වමි.

**(iv)** සමස්තයක් ලෙස ඉදිරි සංවර්ධනය සඳහා වන යෝජනා ද සැළකිල්ලට ඔබ විසින් මෙම විගණන විමසුමෙහි කරුණු දක්වා ඇත.

ඉදිරි සංවර්ධනය සඳහා යෝජනා කර ඇති II වන අදියර මෙම ආපන ශාලාවේ දිගුවක් ලෙස සහ 2 වන මහල සංවර්ධනය සඳහා වන නව ව්‍යාපෘතියක් ලෙස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

මෙය පිරිවැය සංශෝධනයක් නොවන බැවින් පිරිවැය පරීක්ෂණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය නැත.

**(v)** උපදේශක සේවාව සඳහා ගෙවීමට නියමිතව පවතිනුයේ මෙම කොන්ත්‍රාත්තුවට අදාලව උපදේශක සමාගම විසින් ලබාදුන් සේවාවට අදාල ගාස්තුව පමණක් වේ. ඉදිරි සංවර්ධනයන් සඳහා වන දෙවන අදියර වෙනම ව්‍යාපෘතියක් ලෙස යෝජනා වීමට නියමිත අතර එහිදී යම් උපදේශක සමාගමක් ලබා දෙන සේවාවට අදාල ගාස්තුව එම ව්‍යාපෘතිය මගින් ගෙවනු ලැබේ.

**(vi)** තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව **Lowest Substantively Responsive Bidder** සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. ටෙන්ඩර්පත් ඉදිරිපත් කල අනෙක් තරඟකරුවන් දෙදෙනෙක් ලබා දුන් ලංසු බැඳුම්කරණයෙහි දිනයන් ප්‍රමාණවත් ලෙස ලබා නොදීම සහ ලංසු කොන්දේසි මත ලංසු ඇපකර ඉදිරිපත් නොකිරීම යන කරුණු මත ප්‍රධාන මගහැරීම් **(Major Deviations)** අනුව ප්‍රතික්ෂේප වී ඇත.

## 5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### 5.1 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

**(අ)** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PPD/RRD/01/04/2014/01 හි අඩංගු අරමුණු අනුව සකස් කිරීමට උත්සාහ ගන්නා අතර ඇතැම් අවස්ථාවල කාලීන අවශ්‍යතා හා විවිධ බාධාවන් නිසා එම අරමුණු වෙනස් කිරීමට සිදු වී ඇත.

**(ආ), (ඇ)**

අයවැය මඟින් ලබා දුන් මුළු ප්‍රතිපාදනයෙන් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 45 පමණක් වෙන්ව තිබූ අතර ඒ අනුව මුල් ඇස්තමේන්තුව සංශෝධනය කරමින් ප්‍රමුඛතාවයෙන් ඉහල සහ බිල්පත් අතැතිව පැවති ව්‍යාපෘති සඳහා යම් ප්‍රමාණයක ප්‍රතිශතයක් ලෙස මුදල් වෙන් කිරීමක් සිදුකරන ලදී.

මුලදී වෙන්කල යුතු ප්‍රතිපාදන ආසන්න වශයෙන් තක්සේරු කර තිබූ නමුත් අයවැය ප්‍රතිපාදනයෙන් ඉතා කුඩා ප්‍රතිශතයක් පමණක් වෙන් කරන ලදී.

අයවැය විසින් ලබා දුන් ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවූ බැවින් ඒ ඒ ප්‍රතිපාදන සඳහා අවශ්‍ය සත්‍ය අවශ්‍යතාවය මත නොව යම් ප්‍රතිශතයක් මත එක් එක් ව්‍යාපෘති සඳහා වෙන්කල අතර, යම් ව්‍යාපෘතියක බිල් ලැබීම් මත අතිරේක ප්‍රතිපාදනයන් ඉල්ලුම් කරමින් ගෙවා ඇත.

### 5.2 <u>අයවැය ලේඛණමය පාලනය</u>

- ඇස්තමේන්තු සකස් කරනුයේ පෙර වර්ෂවල සත්‍ය වියදම් හා ඉදිරි වර්ෂයේ සැලසුම් හා විවිධ උපකල්පන පදනම් කර ගෙනය. සාර්ව ආර්ථික තත්වයන්ගේ විචලතාවයන් හේතු වන අතර එබඳු විචලතාවයන් අවම කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

- පහත සඳහන් වැය විෂයන් යටතේ 2015 අයවැය ලේඛනයේ මුදල් වෙන්කර තිබුණ ද, මෙම වර්ෂය තුල වියදම් දරා නැත.

| වැය අංකය | වැය විෂය | වෙන්කරන ලද මුදල (රු:'000) |
|---|---|---|
| 809 | Rates & Taxes to lacal Authorities | 500 |
| 919 | Corparate Planing | 350 |
| | | 850 |

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015.08.31 දිනැති ලිපිය මගින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ තොරතුරු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති සඳහා රු:මිලියන 10 ක ප්‍රතිපාදන 2015 අගෝස්තු මස ලබා දී ඇති අතර එම මිලදී ගැනීම් වලට අදාල ප්‍රසම්පාදන කටයුතු වර්ෂය අවසාන වන විට සිදු කරමින් පැවති අතර 2015.12.31 දින වන විට මිලියන 8.6 සඳහා ඇණවුම් යවා ඇත. 2016 වර්ෂයේ මෙම භාණ්ඩ ලැබී ඇති අතර එම ගෙවීම් පිළිබඳ විස්තර අමුණා ඇති ලේඛණයේ දැක්වේ.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

**2013 වාර්ෂික වාර්තාව**

2013 වර්ෂයේ වාර්ෂික වාර්තා භාෂාත්‍රයෙන් සකස් කරන ලද පිටපත් 07 ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මේ වන විට භාර දී ඇත. ඉන්පසු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා දිනයක් ලබා දෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගිනි. අමාත්‍යාංශය මගින් 2013 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා දිනයක් ලබා දුන් පසු ඒ සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

## 06. පද්ධති හා පාලනයන්

### (අ) කොන්ත්‍රාත් පරිපාලනය

ව්‍යාපෘති ප්‍රමාද වීම් සිදුවීම සඳහා පහත කරුණු සමස්ථයක් ලෙස බලපා තිබුණි.

1. බිල්පත් නියමිත කාල සීමාවේදී ගෙවිය නොහැකි වීම. (ගෙවිය යුතු බිල්පත් ප්‍රමාද කිරීම් වලදී ඊට අදාල පොළිය හෝ දින දීර්ඝයන් ලබා දිය යුතුය.)
2. ස්වභාවික හේතු - වර්ෂා දිනයන්
3. උපදේශන ආයතනයේ උපදෙස් සහ නිර්මාණයන් (Drowings) ලබා දීමේදී සිදුවන ප්‍රමාදයන්

මෙම ඉහත කරුණු අනුව දින දීර්ඝයන් ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවකු හට අයිතියක් ඇත.

ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශ ද සහිතව ප්‍රමාද දඩ අය නොකර දින දීර්ඝයන් ලබා දී ඇත.

ඉදිරියේදී මෙවැනි තත්වයන් පාලනය කිරීම සඳහා උපදේශන ආයතනය සමඟ එළඹෙන ගිවිසුම් වලදී වගන්ති යෙදීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) කාර්යමණ්ඩල පරිපාලනය**

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා මේ වන විට ඇතැම් අධ්‍යයන අංශ සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත. සෙසු අධ්‍යයන අංශවල බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එමෙන්ම, තව දුරටත් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා නැවතත් පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව, පුරප්පාඩු ප්‍රමාණය අවම කරගෙන ඇත. මේ හේතුව මත ඉදිරියේදී බාහිර දේශකයින් බඳවා ගැනීම අවම වන බව සඳහන් කළ හැක.

**මහාචාර්ය එස්.ජේ.බී.ඒ. ජයසේකර**

**උපකුලපති**

ඇමුණුම - 01

# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
# කුලියාපිටිය
# THE WAYAMBA UNIVERSITY OF SRI LANKA
KULIYAPITIYA

දුරකථන අංක : ෆැක්ස් : 037-2282758
Telephone No: Fax : 037-2281392
ලේඛකාධිකාරී : 037-2283165
Registrar
මූල්‍යාධිකාරී : 037-2283168
Bursar
සාමාන්‍ය : 037-2281414
General 037-2281412

මගේ අංකය :
My Number WUSL/GA/BS-2015
ඔබේ අංකය :
Your Number
දිනය :
Date 2016.04.20

Assistant Auditor General
Kurunegala

**ANNUAL VERIFICATION OF INVENTORY ARTICLES - 2015**

The Board of Survey for the year 2015 conducted by this University has been completed. The documents prepared for the following sections are sent herewith accordingly.

**KULIYAPITIYA PREMISES**

1. Vice Chancellor's Office/Registrar's Office/Non Academic Staff Establishment
2. Academic Staff Establishment/Academic Branch/Capital Works
3. General Administration Branch/ Meeting Room /Internal Security/ Drivers' Common Room / Non Academic Staff Common Room /Guest House/
4. Academic Staff Hostel 02/ Administrative Staff Hostel
5. VC Lodge /Non Academic Staff Hostel/ Ayurveda Center
6. Salary Branch / Finance Administration Branch
7. Supply Branch/ Internal Audit Branch
8. Exam Branch/Student Welfare Branch
9. Maintenance Branch
10. Faculty of Business Studies & Finance/Lecture Halls
11. Dept .of Banking & Finance /Dept. of Accountancy / BSF Computer Lab
12. Dept of Insurance & Valuation
13. Faculty of Applied Sciences/Lecture Halls
14. Dept . of Electronics
15. Dept . of Mathematics
16. Dept .of Computing & Information System
17. Boys' Hostels (Kuliyapitiya Premises)
18. Hostel Canteen / Staff Canteen / Landscape Division
19. Deegagamini Girls' Hostels- Kuliyapitiya / New Girls' Hostels- 1
20. Pandukabaya Girls' Hostels- Kuliyapitiya / New Girls' Hostels- 2
21. Main Library
22. English Language Teaching Unit/ Medical Center
23. Physical Education Unit
24. Information Technology Center

MAKANDURA PREMISES

1. Faculty of Agriculture & Plantation / Departments /Lecture Halls/Other Units
2. Faculty of Fisheries & Nutrition/ Departments /Lecture Halls/Other Units
3. English Language Teaching Unit/Physical Education Unit/ Maintenance Unit/Security Unit/Medical Center/Student Hostels/Canteens
4. Library/External Affairs Unit/Staff Development Center/Career Guidance Unit
5. Girls Hostels/Boys Hostels
6. Dept. of Biotechnology /
7. Common Support Unit/Security Unit/English Lang. Teaching Unit/Maintenance Unit
8. Bisobandara Hostel / Sapumal Bandara Hostel
9. Hostels Canteen / Main Canteen
10. Information Technology Center/ Medical Center
11. Finance Administration Unit/ Sroff Counter / Stores
12. New Academic Hotel / Hostel No -01 / Hostel No – 02 / Guest House / Aththanayeke Hostel/ Ranasinghe Hostel / Rupasinghe Hostel
13. Library
14. LT1, LT2, LT3, PBM Lecture hall

**Senior Assistant Registrar**
**GENERAL ADMINISTRATION BRANCH**

CC:

1. Registrar – For your information pl.
2. Internal Audit – For necessary action pl.

ඔබේ අංකය
உமது இலக்கம்
Your No.

මගේ අංකය
எனது இலக்கம்
My No. AE/VL/App/BSF/ BM 109

දිනය
திகதி
Date 11.11.2016

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
இலங்கை வயம்ப பல்கலைக்கழகம்
WAYAMBA UNIVERSITY OF SRI LANKA

දුරකථන
தொலைபேசி
Telephone +94 (0)37 2282758

ෆැක්ස්
தொலைநகல்
Fax +94 (0)37 2281392

ඊ-මේල්
மின்னஞ்சல்
e mail vc@wyb.ac.lk

උපකුලපති කාර්යාලය
உபவேந்தர் காரியாலயம்
Office of the Vice-Chancellor

Mr. IMA Ihalagama,
165, Wewelduwa, Kelaniya.

Dear Mr. Ihalagama,

LETTER OF APPOINTMENT

I have pleasure in informing you that you have been appointed as a Visiting Lecturer in the **Department of Business Management** of the **Faculty of Business Studies & Finance with effect from 15.08.2016 to 01.01.2017** to conduct lectures on **Commercial Law and Industrial Law.** (Theory 60 hrs)

You will be paid at the rate of Rs. 1, 500/- per hour for conducted by you, once the vouchers are forwarded to the Bursar of this University certified by the Head of the Department and the Dean of the Faculty. All payments will be made in accordance with the UGC Circular No. 01/2015 dated 22.01.2015.

Time tables and other details could be obtained from the Head of the Department.

If you are employed in the Public Sector you are required to follow the Chapter IX 2.2 of the Government Establishments Code and also to obtain permission to accept this assignment from relevant authorities. Accordingly, you need to pay 1/10 of your payment to the government.

If you are employed in the Public Sector, you are bound to pay the relevant percentages of taxes including PAYE as per the 2016 Circulars of the Department of Inland Revenue.

Accordingly, you need to pay 16% of the payment if it is above Rs. 50, 000/- and 10% of the payment if it is below Rs. 50, 000/-.

Please note that this appointment can be terminated at any time during the period given above.

Yours sincerely,

***Professor SJBA Jayasekera***
***Vice-Chancellor***

VICE-CHANCELLOR
WAYAMBA UNIVERSITY OF SRI LANKA
KULIYAPITIYA

*Cc :* *Dean/ Faculty of Business Studies & Finance*
*Head/ Department of Business Management*
*Bursar*
*Auditor General*
*Senior Assistant Registrar/Common Support Unit - Makandura Premises*
*Assistant Bursar/Makandura Preemies*
*Assistant Registrar/ Faculty of Agriculture and Plantation Management*
*Assistant Internal Auditor*
*Statistical Officer*

*E: /AE04/Visiting Lecturers/App/BSF/DBM/Appointments*

ලයනල් ජයතිලක මාවත, කනදුල්ල, කුලියාපිටිය, ශ්‍රී ලංකාව - 60200
லயனல் ஜயதிலக மாவத்த, கனதுல்ல, குளியாப்பிட்டிய, இலங்கை - 60200
Lionel Jayathilake Mawatha, Kanadulla, Kuliyapitiya, Sri Lanka – 60200
Web: www.wyb.ac.lk

5013 ,

අමුණුම - 03

R 4522

4692

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
උසස් අධ්‍යාපන අංශය
உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு
உயர் கல்விப் பிரிவு
MINISTRY OF HIGHER EDUCATION & HIGHWAYS
HIGHER EDUCATION DIVISION

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | HE/FIN/12/13/WUSL | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2016.10. 27 |

DSAR/ME
pls sfy
10/11

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**<u>පුස්තකාල පොත්/ සඟරා මිලදී ගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල් ගිණුම් වලින් ලියාහැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2016.09.26 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව ඉහත අලාභය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2016 හි උපදෙස් වලට අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

චක්‍රලේඛයෙහි පිටපතක් අමුණා ඇත.

ඩබ්.කේ.එල්.ඊ.වලල්ලාවිට
ප්‍රධාන ගණකාධිකාරී
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

Bursar
+ ... M
11/11

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/06/CIR/2016/02
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.02.12

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක; 02/2016

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

<u>1992 මුදල් රෙගුලාසි යටතේ වන මු.රෙ.108 සංශෝධනය කිරීම</u>

මු.රෙ. 108 හි සඳහන් හානි සම්බන්ධයෙන් කටයුතු කළ යුතු සීමාවන් කාලීන අවශ්‍යතාවය අනුව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අවධානය යොමු වී ඇත. ඒ අනුව 1992 මුදල් රෙගුලාසි යටතේ වන මු.රෙ.108 පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

මු.රෙ. 108 - හානි සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු බලධරයෝ
යම්කිසි නව ප්‍රතිපත්තියක් සම්බන්ධව නැති කල්හි මෙහි පහත සඳහන් අවස්ථාවලදී හානි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට පහත සඳහන් නිලධාරීන්ට බලය දෙනු ලැබේ.

වගුව 01

| හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ලත් නිලධාරියා | හානිය පිළිබඳ විස්තර | මුල්‍ය සීමාව |
|---|---|---|
| ලේකම්වරයෙකු වන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා | (අ) සාමාන්‍ය වියැලීම් හා හැකිලීම් හා නරක් වීම් යනාදිය | භාණ්ඩාගාරය විසින් නියම කරනු ලැබූ ප්‍රතිශතයන් ඇතුළත |
| | (ආ) මුහුදේ දී හෝ ගුවනේ දී සිදුවන හානි | වටිනාකම රු. 2,000,000/- නොඉක්මවන හානි |
| | (ඇ) වෙළෙඳුන්, නැව්ගත කරන්නන් නැව් සමාගම් නියෝජිතයන් හෝ බඩු ගොඩබාන සමාගම් යන මේවායේ කොන්ත්‍රාත්තු ගිවිසුම් පැහැර හැරීම තුළින් ඇති වන හානි | |
| | (ඇ) මෙහි පහත සඳහන් වෙනත් හානි<br>(i) මු.රෙ. 105 (1) ප්‍රකාර | වටිනාකම රු. 1,000,000/- නොඉක්මවන හානි |
| | (ii) වංචාවක් හෝ පවතින ක්‍රමයේ දෝෂයක් හෝ නොමැති කල්හි | වටිනාකම රු. 2,000,000/- නොඉක්මවන හානි |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ ලේකම්වරයෙකු නොවන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා | මු.රෙ. 105(1) ප්‍රකාර | වටිනාකම රු. 500,000/- නොඉක්මවන හානි |
| ගණන්දීමේ නිලධාරියා | (අ) 104(2) යටතේ වාර්තා කිරීම අවශ්‍ය නොවන හානි | |
| | (ආ) මු.රෙ. 105 (1) ප්‍රකාර | වටිනාකම රු. 250,000/- නොඉක්මවන හානි |

02. නිශ්චිත නියෝග නිකුත් කිරීමෙන් ඉහත වගුව 01 යටතේ ඇති ඕනෑම විධිවිධානයකින් නියම කර තිබෙන සීමාව වැඩි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ප්‍රතිශෝධනය කිරීමට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ඇත.

03. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සහ රජයට අයත් සමාගම් යනාදී ආයතන අලාභහානි පිළිබඳව කටයුතු කිරීමට මු.රෙ. 101 සිට මු.රෙ. 104 දක්වා විධිවිධාන අනුගමනය කරන අවස්ථාවලදී, හානි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට බලය ලත් නිලධාරියා වන්නේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වේ, එහිදී මු.රෙ. 105(1) ප්‍රකාර වටිනාකම රු. 500,000/- නොඉක්මවන හානි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය දෙනු ලැබේ. කෙසේ වෙතත් මෙම සීමාව ඉක්මවන අවස්ථාවලදී, ලේකම්වරයෙක් වන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස, අදාල ආයතනය අධීක්ෂණය කරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරයාට ඉහත වගුව 01 ප්‍රකාර හානි පිළිබඳව කටයුතු කිරීමට ලබා දී ඇති මුල්‍ය සීමාව තුළ හානි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට බලය දෙනු ලැබේ.

04. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වන විට හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියකුට අධිකාර බලය නොමැති සෑම අවස්ථාවකදීම අදාල කාරණය පිළිබඳ සම්පූර්ණ විස්තර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කලයුතු වේ.

05. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සහ රජයට අයත් සමාගම් යනාදී ආයතන සම්බන්ධයෙන් වන විට හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියකුට අධිකාර බලය නොමැති සෑම අවස්ථාවකදීම අදාල කාරණය පිළිබඳ සම්පූර්ණ විස්තර මහා භාණ්ඩාගාරයට (අදාල පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත) වාර්තා කලයුතු අතර එම දෙපාර්තමේන්තු විසින් අදාල ආයතනවල හානි සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය පිළිබඳ නිරීක්ෂණ ද සහිතව එම විස්තර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කල යුතු ය.

06. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ඉහත 04 හා 05 පරිදි ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධව භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් නියෝගය ලබාගනු ඇත.

07. මෙම චක්‍රලේඛය මඟින් සංශෝධිත විධිවිධාන 2016.02.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වමි.

08. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484614 මඟින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතිය හැක.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

4608

Department of Food Science and Technology
Faculty of Agriculture
University of Peradeniya
November 8, 2015

Vice Chancellor
Wayamba University of Sri Lanka
Kuliyapitiya

Dear Sir,

RE: APPOINTMENT OF EXTERNAL LECTURERS AND MAKING PAYMENTS: YOUR REF. WUSL/IA/AGD/AQ/2014/14

This has reference to your letter dated October 23, 2015 regarding the audit query submitted by Assistant Auditor General. I regret my inability to send in a reply before November 06, 2015 as I was on overseas leave. My explanations on the above audit query are mentioned below.

1. The report indicates that I am a permanent employee of Wayamba University of Sri Lanka herein after referred to as University. However, I am not an employee of Wayamba University of Sri Lanka.

2. I was appointed by you as an external lecturer to conduct the course LAS 2252 as per the letter dated to conduct 20 hours of lectures and 10 hours of practical. I have conducted 19 hours of lectures during which I was able to deliver the course materials fulfilling the course aims. In a way, I have saved Rs. 1500.00 for the University. In accordance with the course description provided to me by the University, there are 20 h of practical and I have been assigned to conduct 10 h of outbound practical [please refer to the attachment]. I completed the outbound practical component at the Department of Food Science, University of Peradeniya, slaughter house, Kandy and Crysbro farm, Gampola with the assistance of a junior lecturer from Wayamba University. However, please note that I have neither claimed for these hours nor the University has paid me for this service. The page 5 of the report indicates that I have been paid Rs. 28500.00 [Rs. 1500.00 X 19 h]. Furthermore, please note that I have neither claimed nor have been paid for correcting examination papers.

3. I have conducted the course fulfilling the course aims to the satisfaction of the lecturer–in-charge, Head of the Department and the students, provided question papers and assessed the students at my level best. It is my understanding that whether the lectures and practical sessions have been conducted or not is purely an academic matter.

4. Please note that I used to provide my service to other higher educational institutes at their request not merely to earn money but as a service. As per above [no. 2], the University needs to pay me for the services provided. A copy of the course description is attached hereto for your perusal.

Yours truly,

Dr. Terrence Madhujith

Asst. Int. Auditor

110

ඇමුණුම - 05

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
කුලියාපිටිය
THE WAYAMBA UNIVERSITY OF
SRI LANKA
KULIYAPITIYA

දුරකථන අංක : ලෙකුලපති : 037 2282758
Telephone No: Fax : 037-2281392
ලේඛකාධිකාරී : 037-2283165
Registrar
මූල්‍යාධිකාරී : 037-2283168
Bursar
සාමාන්‍ය : 037-2281414
General 037-2281412

මගේ අංකය : My Number WUSL/GA/D/LAND/M/CRI
ඔබේ අංකය : Your Number
දිනය : Date 2016.04.20

ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය

පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් මාකඳුර වත්ත අක්කර 05 ක භූමි ප්‍රමාණයක් වයඹ විශ්වවිද්‍යාලයට පවරා ගැනීම

යථොක්ත කරුණ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් ලේඛකාධිකාරීට පිටපතක් සහිතව ඔබ වෙත එවන ලද අංක: MPI/DEV3/01/Wayamba/04 හා 2016.03.21 දිනැති ලිපිය හා බැඳේ. (ලිපියේ පිටපතක් අමුණා ඇත)

එම ලිපියට අනුව, උක්ත ඉඩම පවරාගැනීම වෙනුවෙන් වයඹ විශ්වවිද්‍යාලය විසින් පොල් පර්යේෂණ ආයතනයට ගෙවා ඇති රු. මි. 10 ක මුදල, ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයට ඉඩමේ අයිතිය පැවරීමෙන් පසුව සිදුකරන ලද සංවර්ධන කටයුතු වෙනුවෙන් රජයේ තක්සේරු වටිනාකම ලබාගැනීමක් පමණක් බවත් එය ඉඩම් විකිණීමක් නොවන බවත් සඳහන් කර ඇත.

ඉහත ඉඩම වයඹ විශ්වවිද්‍යාලයට පවරා නොගැනීම සම්බන්ධයෙන් විගණන විමසුම් රාශියකට මුහුණ දීමට සිදුවී ඇති බැවින් හා මේවනවිට විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකර ඇති බැවින් මෙම ඉඩම නීත්‍යානුකූලව වයඹ විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී
සාමාන්‍ය පාලන අංශය

අත්/කළේ- ජී පියරත්න
ලේඛකාධිකාරී

පිටපත්:

1. ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
2. ලේකම්, වැවිලි කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
3. ප්‍රාදේශීය ලේකම්, පන්නල ප්‍රාදේශීය සභාව - අවශ්‍ය කටයුතු සඳහා
4. වැඩ බලන නි. ලේඛකාධිකාරී - කා.දැ.ස.

O/C